# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# බාහිර උපාධි පාඨමාලා විවරණිකාව - 2026 / 2027

# Prospectus For External Degree Programmes - 2026/2027

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**University of Sri Jayewardenepura**

**විශ්වවිද්‍යාලයීය ලාංඡනය - The Emblem of the University**

---

**විශ්වවිද්‍යාලයීය ආදර්ශ පාඨය - The Motto of the University**

**"විජ්ජා උප්පතතං සෙට්ඨා"**

---

**විශ්වවිද්‍යාලයීය දැක්ම - The Vision of the University**

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යවත් කිරීම

---

**විශ්වවිද්‍යාලයීය මෙහෙවර - The Mission of the University**

අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයන්ගෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ගීතය
# Anthem of University of Sri Jayewardenepura

ශ්‍රී ලංකා පින්බර රන් දෙරණේ
ශ්‍රී නිවාස වූ මහ අගනගරේ
ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ
ශ්‍රී නාමය රඳවවූ ලෝ මුදුනේ

හික්කඩුවේ සිරි සුමඟල් සමිඳුන්
වැලිවිටියේ සෝරත බඳු යතිඳුන්
බිහිකළ විද්‍යෝදය විදු බිම දුන්
එළියෙන් - දිවි මග සරසවු

අයුක්තියේ දී විවාදශීලී
අසත්‍යයේ දී විචාරශීලී
වියත් සබා මැද සමාජ්ශීලී
වියතුන් වී දැය පොබයවු
විජ්ජා උප්පතතං සෙට්ඨා..//



**ගේය පද රචනය**
සේවාර්පිත මහාචාර්ය සුනිල් ආරියරත්න

**තනු නිර්මාණය සහ සංගීතය**
ආචාර්ය රෝහණ වීරසිංහ

# බාහිර උපාධි පාඨමාලා විවරණිකාව - 2026/ 2027

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

ISBN-978-955-9054-73-3

**සංස්කරණය**

මහාචාර්ය පූජ්‍ය පනහඩුවේ යසස්සි හිමි - (පාඨමාලා සමායෝජක - ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව)

**සම්බන්ධීකරණය**

මහාචාර්ය ජී. ඩී. වී. රූපිකා සේනාධීර මිය (අධ්‍යක්ෂ - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය)

**පිට කවරය**

යසිරු ද සිල්වා මහතා (වැඩසටහන් සම්පාදක - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය)

# උපකුලපතිතුමාගේ පණිවුඩය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්.
පත්මලාල්
උපකුලපති

ඔබගේ ජීවිතයේ අධ්‍යාපන කඩඉම් ජයගැනුමට දිවයිනේ රාජ්‍ය විශ්වවිද්‍යාල අතුරින් ප්‍රමුඛතම රාජ්‍ය විශ්වවිද්‍යාලයක් ලෙස වසර ගණනාවක පටන් අභිමානවත් ගමනක නිරත වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමග එක්වීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස ප්‍රථමයෙන් මාගේ සුභාශිංසන එක් කරනු කැමැත්තෙමි.

1959 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සිය ආරම්භය සනිටුහන් කළ ද එහි අතීතය මීට වසර 150 කට පමණ පෙරාතුව විද්‍යෝදය පිරිවෙනහි ආරම්භය දක්වා දිව යන්නකි. ආරම්භයේදී ශිෂ්‍යයින් 14 දෙනෙකුගෙන් පමණක් ශ්‍රී සුමංගල මන්දිරයේදී අධ්‍යයන කටයුතු සිදු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි වර්තමානයේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි පමණක් අභ්‍යන්තර සිසුන් හාරදහසකට ආසන්න ප්‍රමාණයක් ද බාහිර සිසුන් ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් ද අධ්‍යයන කටයුතු වල නිරත වේ.

සුවිශේෂී ක්‍රමවේදයන් ඔස්සේ එයටම ආවේණික වූ අනන්‍යතාවයක් ගොඩනගා ගැනීමට සමත්ව ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තම දැනුම බෙදාදීමේ නිම් වළලු පුළුල් කරමින්, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය, සමාජීයවිද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය, ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය සහ ශාස්ත්‍රවේදී ව්‍යවහාරික පොලිස් අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව යන උපාධි පාඨමාලා හතර හැදෑරීමේ වරම් ඔබට උදාකර දී ඇත.

අධ්‍යාපනයට පමණක් සීමා නොවූ දැක්මක් සහිත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛතම පරමාර්ථයක් වනුයේ බුද්ධිමතුන් සේම විනය ගරුක සමාජයක් බිහි කිරීමෙහි ලා මනා හැදියාවකින් යුත් ගුණවතුන් ද බිහි කිරීමයි. ඉතාමත් ප්‍රවීණ මනා පුහුණුවකින් යුත් ආචාර්ය, මහාචාර්යවරුන්ගෙන් සැදුම්ලත් දේශක මණ්ඩලයකගේ සහය සහ මඟපෙන්වීම නිබඳව ඔබට ලැබෙන අතර ඉතා සුහදශීලී කාර්ය මණ්ඩලයකගේ සේවාව නිරන්තරයෙන් ඔබගේ කටයුතු පහසු කර දෙනු ඇත.

ඉහළ ප්‍රමිතිගත උපාධිධාරියෙක් බිහි කරනු වස් නව තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ යාවත්කාලීන කළ දැනුමින් ඔබව සන්නද්ධ කිරීමත්, ඔබට අවශ්‍ය සියලු ආකාරයේ සම්පත් මූලාශ්‍ර හා නොමඳ සහය ලබා දීමත් වගකීමක් කොට සළකන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒ වෙනුවෙන් ඇපකැප වනු ඇත.

අභියෝගාත්මක ඉලක්ක හමුවේ අප්‍රතිහත ධෛර්යයකින් යුතුව කටයුතු කරමින් ගුණාත්මක උපාධිධාරියෙක් ලෙස බිහිවී සමාජයට විශිෂ්ට සේවාවක් ඉටු කරමින් ජීවිතය ජයගැනුමට ඔබට සියළු ධෛර්යය හා ශක්තිය ලැබේවායි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස සුභාශිංසන එක් කරමි.

## පීඨාධිපතිතුමාගේ පණිවුඩය - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ශිරාන්ත හීංකෙන්ද**

**පීඨාධිපති**

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල අතර මූලිකත්වයෙහි ලා සැලකෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයට අ.පො.ස. උසස් පෙළ විභාගය හොඳින් සමත් වූ ඔබ සැම බාහිර උපාධි අපේක්ෂකයන් වශයෙන් සාදරයෙන් පිළිගනිමි. මානව සංවර්ධන නිර්ණායක ඔස්සේ බලන කල්හි දියුණු වෙමින් පවතින රටවල් අතර ශ්‍රී ලංකාවට විශේෂ ස්ථානයක් හිමි වන බව අප සැවොම දන්නා කරුණකි. මීට ප්‍රධානතම හේතුව වශයෙන් අධ්‍යාපන සාක්ෂරතාවෙන් ශ්‍රී ලාංකේය ජනතාව වඩාත් ඉහළ ස්ථානයක පසුවීම පෙන්වා දිය හැකිය. එසේ වුවද, තවමත් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන අතිදක්ෂ සිසුන්ගෙන් අභ්‍යන්තර සිසුන් වශයෙන් ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුළු වීමට වරම් ලැබෙන්නේ සුළු පිරිසකටය. නමුත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය "ඉගෙනුම තුළින් ජීවිත සමෘද්ධිමත් කිරීම" යන සිය දැක්මට අනුව අභ්‍යන්තර සිසුන්ට අමතරව දැයේ දරු දැරියන් විශාල පිරිසකට බාහිර උපාධි වැඩසටහන් මගින් උසස් අධ්‍යාපන අවස්ථා සලසමින් සිටියි. එකී සේවාවේ පුරෝගාමී මෙහෙවර ඉටු කිරීමට මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයට හැකිවීම එදා මෙදාතුර ලැබූ ඓතිහාසික ජයග්‍රහණයක් බවද පැවසිය යුතුය. මේ වනවිටත් අප පීඨය මගින් බිහි කළ බාහිර උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් රටේ ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල සේවයේ නියුතු වෙමින් සිටින බව මෙහිදී ප්‍රකාශ කරනුයේ සාඩම්බරයෙනි.

ඒ අනුව මෙම පීඨය යටතේ බාහිර උපාධි පාඨමාලා හතරක් (04) ක්‍රියාත්මක වේ. එනම් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව, සමාජීයවිද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව, ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව හා ශාස්ත්‍රවේදී ව්‍යවහාරික පොලිස් අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව වේ. ඉහත පාඨමාලාවලින් ශාස්ත්‍රවේදී ව්‍යවහාරික පොලිස් අධ්‍යයන බාහිර උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා පොලිස් සේවයේ නියුතු නිලධාරීන් සඳහා පමණක් සීමාවන උපාධි පාඨමාලාවක් වේ.

ඒ අනුව මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය යටතේ බාහිර උපාධි අපේක්ෂකයන් වශයෙන් අධ්‍යයන කටයුතු අරඹන ඔබ සැමගේද පොදු ප්‍රාර්ථනයද සමගින් නියමිත අධ්‍යයන කාලය අවසානයේ සාර්ථක ලෙස උපාධිය නිම කිරීමට හැකි වී, ඉන් ජීවිත ආලෝකමත් කර ගැනීමට අවකාශ සැලසේවා'යි පීඨාධිපති වශයෙන් මම ශුභාශංසන එක්කරමි.

## අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය



මහාචාර්ය රූපිකා සේනාධීර

*අධ්‍යක්ෂ*

ජයග්‍රාහී අනාගතයක් කරා පිවිසෙන ශ්‍රී ලාංකේය දරු පරපුර වෙත මාගේ ආශිර්වාදාත්මක සුභාශිංසන ප්‍රථමයෙන් පළ කර සිටිමි. ජීවිතයේ අප ලද වටිනාම ආයෝජනය අධ්‍යාපනය යි. සාර්ථක වෘත්තීය ජීවිතයක සිහින මංපෙත් විවර කරන උසස් අධ්‍යාපන අවස්ථා රැසක් කරා පියමනින ඔබ තෝරා ගත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය ඔබට ඒ සඳහා මග විවර කර දෙනු ඇත. ඔබගේ විෂය ධාරාව කුමක් වුවත් ඒ සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විශිෂ්ටතම ආචාර්ය මඬුල්ලක සම්පත් දායකත්වයෙන් ඔබගේ ඉගෙනුම් ක්‍රියාවලිය සන්නද්ධ කරගැනීමට හැකි වීම ඔබ ලබන සුවිශේෂී අවස්ථාවකි.

වර්ෂ 1873 දී විද්‍යෝදය පිරිවෙන ලෙස ප්‍රභවය වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපනයේ ප්‍රමුඛ නියෝජනයක් වන්නා සේ ම ඒ යටතේ තම උපාධි සිහිනය සැබෑ කර ගැනීමට ලැබීම ද ඔබ ලබන භාග්‍යයකි. සිද්ධාන්ත සහිත විෂයානුබද්ධ ඉගැන්වීම් සහ ප්‍රායෝගික ඉගෙනුම් අවස්ථා ද සහිතව නව තාක්ෂණික අනුගතවීම් තුළින් ඔබගේ උපාධි පාඨමාලා සකස් වී ඇත. නිරන්තරයෙන් යාවත්කාලීන වන පාඨමාලා ඒකකයන් තුළින් අනාගත වෘත්තීය මාර්ග කරා පහසුවෙන් ළඟා විය හැකි වීම ද විශේෂත්වයකි. උපාධි අපේක්ෂකයෙකු ලෙස ඔබට මේ හරහා ලබාගත හැකි අවස්ථා සහ තේරීම් ප්‍රමාණය අසීමිත වන අතර නවමු ගෝලීය අධ්‍යාපන රටාවන් ද මෙහි දී අත්විඳිය හැකිය.

වැඩිදුරටත් මෙම උපාධි අපේක්ෂක විවරණිකාව කියවීමෙන් ඔබට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ප්‍රදානය කරන සියලු උපාධි පාඨමාලාවන් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලැබෙනු ඇත. ඔබගේ මීළඟ වසර කිහිපය අතිශය සාර්ථක වීම සඳහා ඔබ දැනටමත් උදාකරගත් අවස්ථාව උපරිම කැපවීමෙන් ක්‍රියාවට නංවන ලෙස ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

ශ්‍රී ලාංකේය සංවර්ධනයට ඔබගේ දායකත්වය සැපයීමටත්, විදේශීය වෘත්තීයභාවය සවිමත් කර ගැනීමටත්, නව උසස් අධ්‍යාපන අවස්ථා විවර කර ගැනීමටත් ඔබ ලද මෙම උපාධි අපේක්ෂක වත්කම ශක්තිමත් මූලාරම්භයක් වන බව දත යුතු ය. ඔබ සැමගේ වටිනා අනාගතය ජයග්‍රාහී අධ්‍යාපනය මගින් සඵල වේවා යන්න මාගේ ප්‍රාර්ථනය යි !

# ලේඛකාධිකාරීතුමාගේ පණිවුඩය - - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



ඒ.බී. වැලිවිට

ලේඛකාධිකාරී

2026/2027 වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය, සමාජීයවිද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය, ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය සහ ශාස්ත්‍රවේදී ව්‍යවහාරික පොලිස් අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය යන උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වූ නවක උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් සකස් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා විවරණිකාව වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

මෙරට ජාතික විශ්වවිද්‍යාල අතර ඉහළින්ම වැජඹෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂකයකු ලෙස ලියාපදිංචි වී උසස් අධ්‍යාපනය හැදෑරීමට ඔබ විසින් ගනු ලැබූ බුද්ධිමත් තීරණය මා සමස්ත විශ්වවිද්‍යාල පරිපාලනය වෙනුවෙන් අගය කරමි. එය අප දකිනුයේ අප විශ්වවිද්‍යාලයේ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යාපන ක්‍රියාවලිය හා මනා කළමනාකාරීත්වය කෙරෙහි ඔබ තැබූ විශ්වාසයක් ලෙසිනි.

ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචියේ සිට උපාධි සහතිකය ලබාගැනීම දක්වා සමස්ත ක්‍රියාවලිය තුළ නවීන තාක්ෂණය භාවිත කරමින් කඩිනම් හා සුහදශීලී සේවයක් ලබාදීමට සමස්ත කාර්ය මණ්ඩලයම කැපවී සිටින බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ඔබ උපාධිය හදාරණ කාලය තුළ ඔබට යම් පරිපාලනමය කාර්යයක් ඉටුකර ගැනීමට සිදුවුවහොත් හෝ යම් පරිපාලනමය ගැටළුවක් ඇතිවුවහොත් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර ලේඛකාධිකාරී, නියෝජ්‍ය ලේඛකාධිකාරී, අධ්‍යක්ෂ හෝ මා හමු වී එය කඩිනමින් නිරාකරණය කරගැනීමේ හැකියාවක් ඇති බව ද දන්වනු කැමැත්තෙමි. නියමිත කාලය තුළ ඔබගේ උපාධිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පරිපාලනමය පහසුකම් මාගේ කණ්ඩායම විසින් ඔබ වෙත ලබාදීමට බැඳී සිටින බවද සතුටින් ප්‍රකාශ කර සිටිමි.

# පටුන


**1.** හැඳින්වීම.............................................................................................................................…. 11

**2.** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය........................................................................... 12

**3.** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව සහ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩල............................................................................................................................ 13

**4.** බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය.................................................................................. 14

**5.** මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය යටතේ ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා........................................................................... 19

5.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 21

5.2 සමාජීයවිද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 40

5.3 ශාස්ත්‍රවේදී ව්‍යවහාරික පොලිස් අධ්‍යයනය බාහිර උපාධි පාඨමාලාව .............................. 43

**6.** ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාවලිය…………………………………………………………… 47

**7.** ඇගයීම් ක්‍රමය……………………………………………………………………………… 47

**8.** ශ්‍රේණි පටිපාටිය සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA)............................................................. 49

**9.** විභාග නිර්ණායක, GPA සහ උපාධි ආවශ්‍යකතා.................................................................... 52

**10.** පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය.......................................................................................................... 55

**11.** විභාග අක්‍රමිකතා ........................................................................................................... 57

**12.** උපාධිය වලංගු වන දිනය.............................................................................................................. 60

# 1. හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වූකලී ශිෂ්‍ය සංඛ්‍යාව අතින් මෙරට ඇති විශාලතම විශ්වවිද්‍යාලයයි. එය ආරම්භ වූයේ 1959 වර්ෂයේ දී වුවත් එහි අතීතය වර්ෂ 1883 දී හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් විසින් ආරම්භ කරන ලද එවකට දේශීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් වූ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන දක්වා ඈතට දිව යයි. වත්මන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආරම්භක අධ්‍යාපන ආයතනය වන්නේ එම විද්‍යාස්ථානයයි. එනයින් ගත් කළ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය ශත වර්ෂයකටත් වඩා වැඩි වන අතර 2023 වනවිට වසර 150 කි. 1958 අංක 45 දරන විශ්වවිද්‍යාල පනතට අනුව **විද්‍යෝදය විශ්වවිද්‍යාලය** නමින් 1959 පෙබරවාරි 18 වන දින කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙහි ශ්‍රී සුමංගල මන්දිරයේ ශිෂ්‍යයින් 14 දෙනකුගෙන් ස්ථාපිත කරන ලද මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රථම විශ්වවිද්‍යාලයාධිපතීන් වහන්සේ ලෙස පත් වූයේ සාහිත්‍ය චක්‍රවර්ති, රාජකීය පණ්ඩිත අතිගෞරවාර්හ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේ ය. 1961 නොවැම්බර් මස 22 වන දින මාලිගාකන්දේ සිට වර්තමාන විශ්වවිද්‍යාල පරිශ්‍රය පිහිටා ඇති ගංගොඩවිල භූමි භාගය වෙත විශ්වවිද්‍යාලය රැගෙන එන ලදි. 1972 අංක 01 දරන ලංකා විශ්වවිද්‍යාල පනත මගින් සිදු කරන ලද සංශෝධන අනුව විද්‍යෝදය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපය වශයෙන් නම් කෙරිණි. දැනට ක්‍රියාත්මක 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මගින් එය **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය** ලෙසින් යළිත් ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වර්තමාන පීඨ සංඛ්‍යාව එකොළහක් වුවත් එහි ආරම්භක යුගයේ දී පැවතියේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විෂයක්ෂේත්‍ර නියෝජනය කරන කලා, බෞද්ධ අධ්‍යයන, දර්ශනය සහ භාෂා යන පීඨයන් පමණි. 1966 වසරේ දී එකී පීඨ හතර ඒකාබද්ධ කරමින් **ශාස්ත්‍ර පීඨය (කලා පීඨය)** බිහි වූ අතර ඒ යටතේ අධ්‍යයනාංශ 12 ක් ක්‍රියාත්මක වූ බව ඉතිහාසයේ දැක්වෙයි. මීට සමගාමීව පිළිවෙලින් 1966 දී සහ 1972 දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ප්‍රථම ව්‍යවහාරික විද්‍යා පීඨයත්, ප්‍රථම කළමනාකරණ පීඨයත් පිහිටුවමින් සීඝ්‍රයෙන් දියුණුවට පත්වන ජාතික විශ්වවිද්‍යාලයක් බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පත් විය. වසර 50 කට ආසන්න කාලයක් පුරා ලෝකප්‍රකට පඬිවරුන් බිහි කළ කීර්තිමත් පීඨයක් බවට පත්ව තිබූ ශාස්ත්‍ර පීඨය, **මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය** ලෙසින් 2011 වසරේ දී නාම සංශෝධනයකට ලක් විය. වර්තමානයේ අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි හා වාග්විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, භූගෝල විද්‍යාව, ඉතිහාස හා පුරා විද්‍යාව, භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසාංගික කලා, සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද, පාලි හා බෞද්ධ අධ්‍යයන, මානව විද්‍යාව, දර්ශනය හා මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, සිංහල හා ජනසන්නිවේදනය, සමාජ සංඛ්‍යානය, සමාජ විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යන අධ්‍යයනාංශ 16 යටතේ අභ්‍යන්තර උපාධි පාඨමාලා 33 ක් ක්‍රියාත්මක වන අතර බාහිර උපාධි පාඨමාලා 04 ක් ක්‍රියාත්මක වෙයි. දළ වශයෙන් හාරදහසකට ආසන්න අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවක් ද ලක්ෂයකට ආසන්න බාහිර ශිෂ්‍ය සංඛ්‍යාවක් ද වර්තමානයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය යටතේ ඉගෙනුම ලබති.

## 2. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් බාහිර උපාධි පාඨමාලා ප්‍රදානය කිරීමේ ඉතිහාසය දශක හයකට ආසන්න කාලයක් දක්වා ඈතට දිව යයි. එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලය මගින් හඳුන්වා දුන් පාඨමාලා අතර ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව ද ඉතා ජනප්‍රිය වූවකි. ශාස්ත්‍රාභිලාශී විශාල පිරිසකට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉඩක් නොමැති වීමත්, මුල් අවධියේ දී අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස කාන්තාවන් බඳවා නොගැනීමත් බාහිර 'කලා' උපාධි පාඨමාලාව හඳුන්වා දීමට හේතු විය. එවකට ලක්දිව ප්‍රකට විද්‍යායතන පිරිවෙන් මගින් විද්‍යෝදය බාහිර කලා උපාධි පාඨමාලාව සඳහා ඉගැන්වීම් සිදු කරමින් සුවිශාල දායකත්වයක් සපයන ලදී. 1972 සංශෝධිත පනතට අනුව බාහිර උපාධි පාඨමාලා සහ ඊට අදාළ විභාග පැවැත්වීම සඳහා සියලු විශ්වවිද්‍යාලවලට පොදු එක් බාහිර උපාධි ඒකකයක් ස්ථාපිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් දීර්ඝ කාලයක් පවත්වාගෙන ආ බාහිර උපාධි පැවැත්වීමේ අයිතිය විශ්වවිද්‍යාලයට අහිමි විය. 1978 සංශෝධනයෙන් පසුව යළිත් සීමිත අවස්ථාවක් හිමි වූ අතර ඒ අනුව ශාස්ත්‍රවේදී සහ විද්‍යාවේදී උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ද, වාණිජවේදී උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ද භාර කරමින් ප්‍රතිසංවිධානය විය. එයට සමගාමීව 1979 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා මෙහෙයවීම සඳහා **බාහිර උපාධි ඒකකය** නමින් වෙනම අංශයක් පිහිටුවන ලදී. 1991 දී නැවත වරක් ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලා පැවැත්වීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අවස්ථාව ලබාගත හැකි වූ අතර 1997 දී විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන හා ව්‍යාපාර පරිපාලන බාහිර උපාධි පාඨමාලා ද හඳුන්වා දෙනු ලැබීය. 2010 ඔක්තෝබර් මස 15 වන දින නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 ට අනුව ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල මගින් පිරිනැමෙන බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම, පාඨමාලා මෙහෙයවීම හා කළමනාකරණය පිළිබඳ පුළුල් සංශෝධනයක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ එතෙක් ක්‍රියාත්මක වූ බාහිර උපාධි ඒකකය ව්‍යුහාත්මක වෙනසකට ලක්වෙමින් **බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය** බවට පත් විය. උපකුලපතිවරයාගේ වගකීම යටතේ ක්‍රියාත්මක වන අධ්‍යක්ෂවරයකු හා නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් ද, පීඨාධිපතිවරු, අධ්‍යයනාංශ ප්‍රධානවරු, අධ්‍යයන මණ්ඩල සභාපතිවරු, පාඨමාලා සමායෝජකවරු හා දේශකවරුන් ප්‍රමුඛ අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් ද, ලේඛකාධිකාරීවරයා යටතේ ක්‍රියාත්මක නියෝජ්‍ය ලේඛකාධිකාරී, සහකාර ලේඛකාධිකාරී ඇතුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයකින් ද, මූල්‍යාධිකාරී යටතේ ක්‍රියාත්මක ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයකුගෙන් ද මෙම ඒකකය සමන්විත වෙයි. බාහිර උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීමේ සිට උපාධි ප්‍රදානෝත්සවය දක්වා වූ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂමව සහ වගකීම් සහිතව පවත්වාගෙන යනු වස් උපකුලපතිවරයා සභාපතිත්වය දරන කළමනාකරණ කමිටුවේ පූර්ණ පරිපාලනයට සහ අධීක්ෂණයට බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටත් වේ. බාහිර උපාධි පාඨමාලා සම්බන්ධ සියලුම අධ්‍යයන කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ දී උක්ත චක්‍රලේඛය අනුව පිහිටුවා ඇති අධ්‍යයන මණ්ඩල ද, ඒවාට අදාළ පීඨ මණ්ඩල ද, අවසානයේ විශ්වවිද්‍යාලයීය සනාතන සභාව ද අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වෙයි. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය බාහිර උපාධි අපේක්ෂකයන් සම්බන්ධ විශ්වවිද්‍යාලයේ ස්ථාපිත එකම ආයතනය වේ.

## 2.1 බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ ප්‍රධාන කාර්යයන්

- බාහිර උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම.
- විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ දායකත්වය ලබාගෙන දේශන, විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ, ප්‍රායෝගික වැඩමුළු සංවිධානය කිරීම හා පැවැත්වීම.
- විභාග අයදුම්පත් කැඳවීම, විභාග කාල සටහන් සැකසීම, ප්‍රවේශ පත්‍ර සහ විභාග නීති මාලාව අපේක්ෂකයන් වෙත ලබාදීම.
- ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කිරීම සහ අදාළ විභාග මධ්‍යස්ථාන වලට නිකුත් කිරීම, නියමිත දිනට විභාග පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම.
- විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.
- උපාධි ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම සහ පැවැත්වීම.
- තාවකාලික සහතික පත්‍ර, විස්තරාත්මක ශ්‍රේණි සහතික, මුද්‍රිත උපාධි සහතික සහ ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම.

# 3. බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව සහ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩල

විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන බාහිර උපාධි සම්බන්ධ සියලුම පරිපාලන කටයුතු බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව මගින් මෙහෙයවනු ලැබේ. උපකුලපතිවරයා මෙහි සභාපති ධූරය හොබවන අතර, අදාළ පීඨයන්හි පීඨාධිපතිවරුන්, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ අධ්‍යක්ෂ ඇතුළු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව අදාළ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නියෝජිතයන් මෙහි සාමාජිකයෝ වෙති. මෙම කළමනාකරණ කමිටුව විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක වන්නේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතියට යටත්වය.

මීට අමතරව, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨයට අදාළ බාහිර උපාධි පාඨමාලා වලට සම්බන්ධ සියලුම අධ්‍යයන කටයුතු පිළිවෙළින් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩලය සහ ව්‍යවහාරික විද්‍යා පීඨ බාහිර උපාධි අධ්‍යයන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුවේ.

## 4. බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය

### 4.1 ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම වාර්ෂිකව සිදු කෙරේ. මේ සඳහා පුවත්පත්, විද්‍යුත් මාධ්‍ය සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල වෙබ් අඩවිය **(www.external.sjp.ac.lk)** මගින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීම සිදු කරනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල වෙබ් අඩවිය **(www.external.sjp.ac.lk)** මගින් වන අතර අයදුම්කරුවන් වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් යොමු කළ යුතුය.

### 4.2 ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයන්ට අනුකූලව අදාළ අධ්‍යයන වර්ෂය සඳහා සීමිත උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව අදාළ සීමාව ඉක්මවා යන අවස්ථාවලදී ‘Z’ අගය මත හෝ ප්‍රවේශ පරීක්ෂණයක් මගින් හෝ අදාළ අධ්‍යයනාංශය මගින් තීරණය කරනු ලබන වෙනත් ක්‍රමවේදයක් ඔස්සේ නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා 01/2021 චක්‍රලේඛයට අනුව විෂය ගොනුගත ක්‍රමය යටතේ එක් එක් විෂය සඳහා අයදුම් කරන ලද අපේක්ෂක සංඛ්‍යාව සීමාව ඉක්මවා යන අවස්ථාවලදී ඉහළම ලකුණු ලබා ගන්නා අය අතුරින් අදාළ ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගනු ලැබේ. සංගීතය සහ නර්තනය යන විෂයයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයන් අතුරින් අදාළ අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වන්නන් පමණක් තෝරාගනු ලැබේ. එම පරීක්ෂණවල දී අපේක්ෂිත මට්ටමට ළඟා විය නොහැකි අයදුම්කරුවන්ට විෂය ගොනු ක්‍රමය යටතේ ඉදිරිපත් කරන ලද ඊළඟ වරණයට අනුව වෙනත් විෂයයක් තෝරා ගැනීමට සිදුවේ. අවස්ථාවෝචිතව අධ්‍යයන මණ්ඩලය මගින් ගනු ලබන තීරණ අනුව විෂය තෝරා ගැනීම පිළිබඳ නිර්ණායක සංශෝධනය වේ.

### 4.3 ලියාපදිංචි අංකය සහ ශිෂ්‍ය වාර්තා පොත නිකුත් කිරීම

ඉහත නිර්ණායක සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අදාළ අධ්‍යයන වර්ෂයෙහි බාහිර උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබයි. එසේ සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා ලියාපදිංචි අංකයක් සහිත ශිෂ්‍ය වාර්තා පොත නිකුත් කරනු ලැබේ.

බාහිර උපාධි පාඨමාලා සඳහා අයදුම් කර සුදුසුකම් සපුරා ඇති සෑම ශිෂ්‍යයෙකු සඳහාම ලියාපදිංචි කිරීමෙන් අනතුරුව ශිෂ්‍ය වාර්තා පොතක් විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරනු ලබන අතර සිය අධ්‍යයන කටයුතු කරගෙන යාමේ දී විශ්වවිද්‍යාලය සමග කෙරෙන සෑම කාර්යයකදීම එම ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. එම ශිෂ්‍ය වාර්තා පොතෙහි සඳහන් ඇති ලියාපදිංචි අංකය විශ්වවිද්‍යාලය හා සම්බන්ධ වන සෑම අවස්ථාවකදීම සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. තමා ලියාපදිංචි වූ උපාධිය ලබා ගන්නා තෙක් මෙම ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලය සතු වන අතර උපාධිය ලබා ගැනීමෙන් පසු ශිෂ්‍ය වාර්තා පොතේ අයිතිය අපේක්ෂකයා සතුවේ. බාහිර උපාධි අපේක්ෂකයකුගේ ලියාපදිංචිය අවලංගු කළ විට, ඔහුගේ ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලයට බාර දිය යුතුය. බාහිර උපාධි ශිෂ්‍ය වාර්තා පොත අස්ථානගත වූ විට ඒ සම්බන්ධව පොලීසියට පැමිණිල්ලක් කළ යුතු අතර, එම වාර්තාව සමග උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සහ අදාළ ගෙවීම් කළ වවුචරය සමග අතිරේක ඡායාරූපයක් ද ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි පිටපතක් ලබා ගත හැකි වේ.

09/2021 අංක දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත සකස් කරනුයේ ඔබගේ උප්පැන්න සහතිකයේ ඇති නමට වන අතර උපාධි සහතිකය සකස් කරනුයේද උප්පැන්න සහතිකයේ නමට වේ. පවත්නා නීති රීති අනුව ලියාපදිංචියෙන් පසුව ඔබගේ නමෙහි යම් සංශෝධනයක් වේ නම් එය ඔබගේ උපාධි III පරීක්ෂණයට පෙර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත අවශ්‍ය නීත්‍යානුකූල ලේඛන සමග දැන්විය යුතු වේ. ඉහත චක්‍රලේඛයට අනුව ප්‍රතිඵල වලංගු දිනට පසුව උපාධි අපේක්ෂකයින්ගේ නමෙහි සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් පිළිගනු නො ලැබේ.

## 4.4 ලියාපදිංචි කාලසීමාව

බාහිර උපාධි පාඨමාලා සඳහා ප්‍රථමයෙන්ම අධ්‍යයන වර්ෂ තුනක කාල සීමාවකට ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. එම නියමිත කාලය තුළ උපාධි පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වන උපාධි අපේක්ෂකයකු වෙතොත් ඔහු හෝ ඇය තම ලියාපදිංචිය යාවත්කාලීන කර ගැනීම සඳහා නියමිත කාලයේ දී අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එක් වසරක් සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේ ගාස්තුව රු. 5,000/- කි. මෙලෙස ලියාපදිංචිය දීර්ඝ කිරීමේ අවස්ථා 04 ක් හිමිවන අතර ඒ අනුව ලියාපදිංචිය වලංගුවන සම්පූර්ණ කාලය අධ්‍යයන වර්ෂ 07 කි. එම කාලය තුළ ප්‍රථම වසර පරීක්ෂණ අවස්ථා 07 ක්, දෙවන වසර පරීක්ෂණ අවස්ථා 06 ක් සහ තෙවන වසර පරීක්ෂණ අවස්ථා 05 ක් වශයෙන් විභාග අවස්ථා 18 ක් හිමි වේ. කිසිදු හේතුවක් නිසා මෙකී කාලය සහ අවස්ථා දීර්ඝ කරනු නො ලැබේ.

උපාධි පාඨමාලාවට අදාළව ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා වූ ගෙවීම් වවුචර්පත් Student Profile මගින් ලබා ගත හැකිය.

**අධ්‍යයන වර්ෂය සහ ලියාපදිංචියට හිමි උපරිම කාලය යනු -:**

අධ්‍යයන වර්ෂයක් ලෙස අර්ථ දැක්වෙන්නේ කිසියම් පාඨමාලාවකට ලියාපදිංචි වීමේ සිට උපරිම මාස දොලහක් සම්පූර්ණ වන ලිත් වර්ෂයකි. එකී වර්ෂය ඇතුළත අදාළ අවසන් පරීක්ෂණ පැවැත්විය යුතුය. කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා අදාළ අධ්‍යයන වර්ෂයට නියමිත පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට නොහැකි වුවහොත් අධ්‍යයන වර්ෂයක හිමිකම උපාධි අපේක්ෂකයන්ට ලැබෙන පරිදි පහත සඳහන් ක්‍රියාකාරී නිර්වචනය භාවිතයට ගනු ලැබේ.

බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වූ දින සිට උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය ප්‍රථම අධ්‍යයන වර්ෂය වේ. එතැන් සිට උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය දෙවන අධ්‍යයන වර්ෂය වේ. එතැන් සිට උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය තුන්වන අධ්‍යයන වර්ෂය වේ.

ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඉක්ම යන තෙක් ලියාපදිංචිය වලංගු වේ. එම කාලය තුළ උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ තුනකටත් (03), උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ දෙකකටත් (02), උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ එකකටත් (01) ලියාපදිංචිය දීර්ඝ කර නොගෙන පෙනී සිටීමේ අයිතිවාසිකම හිමි වේ.

යථෝක්ත නිර්දේශප්‍රකාරව ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ තුන ඇතුළත උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වන අපේක්ෂකයින් සිවුවන අධ්‍යයන වර්ෂය සඳහා තම ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය. එලෙස අලුත් කරන ලද අධ්‍යයන වර්ෂය තුළ දී උපාධි I, II සහ III කොටස සඳහා පවත්වනු ලබන එක් පරීක්ෂණයකට බැගින් පෙනී සිටීමේ අයිතිවාසිකම හිමි වේ.

මේ ආකාරයට උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීම සඳහා ලියාපදිංචිය අලුත් කිරීමේ අවස්ථා හතරක් එක් අපේක්ෂකයකුට හිමි වේ. ඒ අනුව මුල් ලියාපදිංචි අධ්‍යයන වර්ෂ තුන ද ඇතුළත්ව සමස්ත පාඨමාලාව අවසන් කිරීම සඳහා අධ්‍යයන වර්ෂ හතක් (07) සෑම අපේක්ෂකයකුටම හිමි වේ. මෙම අධ්‍යයන වර්ෂ හතක (07) කාලය තුළ උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ හතකටත් (07), උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ හයකටත් (06), උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ පහකටත් (05) පෙනී සිටීමේ අයිතිවාසිකම පහත වගුවෙන්ද පෙන්නුම් කෙරෙන පරිදි හිමි වේ.

| | **උපාධි කොටස** | **පරීක්ෂණ ගණන** |
|---|---|---|
| උපරිම අධ්‍යයන වර්ෂ 07 කි | උපාධි I | 07 |
| | උපාධි II | 06 |
| | උපාධි III | 05 |
| සම්පූර්ණ විභාග අවස්ථා | | 18 |

## 4.5 පාඨමාලා ගාස්තු හා පරීක්ෂණ ගාස්තු

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ගාස්තු පහත පරිදි වේ.

- ❖ ලියාපදිංචි ගාස්තුව - රු.15,000/- (ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතුය.)
- ❖ පාඨමාලා ගාස්තුව - රු.180,000/-

| පාඨමාලාව | පළමු වාරිකය | දෙවන වාරිකය | තෙවන වාරිකය |
|---|---|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | රු. 60, 000/-<br>(ලියාපදිංචි වීමේදී ලියාපදිංචි ගාස්තුව රු.15,000/- සමඟ රු.75,000/- ගෙවිය යුතුය. ) | රු. 75, 000/- | රු. 45, 000/- |
| සමාජීයවිද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය | රු. 60, 000/-<br>(ලියාපදිංචි වීමේදී ලියාපදිංචි ගාස්තුව රු.15,000/- සමඟ රු.75,000/- ගෙවිය යුතුය. ) | රු. 75, 000/- | රු. 45, 000/- |

- ❖ පාඨමාලා ගාස්තු අයකරනුයේ සමස්ත උපාධි පාඨමාලාව වෙනුවෙනි. උපාධි I කොටසෙහි පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන වාරිකය ගෙවීම අනිවාර්ය වන අතර උපාධි II කොටසෙහි පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර තෙවන වාරිකය ගෙවීම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවකාශය නොලැබේ .

- ❖ දෙවන වාරික හා තෙවන වාරික ගෙවීම් පිළිබඳ විස්තර www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය හරහා පමණක් දැනුම් දෙනු ලැබේ.

## පරීක්ෂණ ගාස්තු

උපාධි I, උපාධි II හා උපාධි III පරීක්ෂණයන්ට වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය. ඊට අදාළ ගාස්තු හා අයදුම්පත්‍ර **www.external.sjp.ac.lk** යන අපගේ වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ. **අදාළ වාරික ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නො ලැබේ.**

### පුනර් අපේක්ෂකයන් සඳහා පරීක්ෂණ ගාස්තු

- ➢ එක් විෂය ඒකකයක් සඳහා රු. 5,000.00
- ➢ විෂය ඒකක 2ක් සඳහා රු. 7,000.00
- ➢ විෂය ඒකක 3ක් සඳහා රු. 9,000.00
- ➢ විෂය ඒකක 4ක් සඳහා රු. 11,000.00
- ➢ විෂය ඒකක 5ක් හෝ ඊට වැඩි රු. 13,000.00

උදාහරණය - SIGE 1001 විෂය ඒකකය පමණක් නම් රු. 5000/- ක් ද SIGE 1001 සහ SIGE 1002 විෂය ඒකක දෙක සඳහා රු. 7000/- ක් ද ගෙවිය යුතුය.

- ***ලියාපදිංචිය අවලංගු කිරීම***

***<u>ඔබ විසින් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද අ. පො. ස. උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය ඇතුලු ලියකියවිලිවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීමේදී අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව සනාථ වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කිරීමටත්, ඔබ විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති කිසිඳු මුදලක් ආපසු නො ගෙවීමටත් විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ලැබේ.</u>***

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ඔබ විසින් ලියාපදිංචිය අවලංගු කරගන්නේ නම්, ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- ***ලියාපදිංචිය අවලංගු කිරීමේ දී ගාස්තු නැවත ගෙවීම***

ලියාපදිංචිය අවලංගු කිරීමේදී මුදල් නැවත ගෙවීමක් සිදු කරනු ලබන්නේ පහත සඳහන් හේතුන්වලට පමණි.

a) **ලියාපදිංචි වු දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම්** සඳහා පමණක් ගෙවන ලද පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. මෙම කාලසීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. ලියාපදිංචි ගාස්තු (රු.15,000/-) නැවත ගෙවනු නොලැබේ.

b) යම් අයකු බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී **ප්‍රථම වසර පරීක්ෂණය පැවැත්වීමට පෙර, රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි වුවහොත්** පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. ලියාපදිංචි ගාස්තු (රු.15,000/-) නැවත ගෙවනු නොලැබේ.

## 5. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය යටතේ ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා

2025/ 2026 අධ්‍යයන වර්ෂය සඳහා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් පහත දක්වෙන උපාධි පාඨමාලා ඉදිරිපත් කරනු ලැබේ.

(අ) ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - අධ්‍යයන වර්ෂ තුනකි.

(ආ) සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - අධ්‍යයන වර්ෂ තුනකි.

(ඇ) ශාස්ත්‍රවේදී ව්‍යවහාරික පොලිස් අධ්‍යයන බාහිර උපාධි පාඨමාලාව - අධ්‍යයන වර්ෂ තුනකි. (මෙම උපාධි පාඨමාලාව පිරිනමනුයේ දැනට පොලිස් සේවයේ නියුතු උසස් නිලධාරීන් සඳහා වන අතර ඔවුන් බඳවා ගැනීම පොලිස් දෙපාර්තමේන්තුව හා විශ්වවිද්‍යාලය අතර ඇති අවබෝධතා ගිවිසුම අනුව සිදුවේ.)

මෙම පීඨයේ පාඨමාලා ඒකක අනිවාර්ය පාඨමාලා ඒකක හා අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා ඒකක වශයෙන් දෙවර්ගයකි. සෑම ශිෂ්‍යයෙකුම තම අධ්‍යයන ක්ෂේත්‍රයට/ක්ෂේත්‍රයන්ට අයත් පාඨමාලා ඒකකවලට අමතරව පළමු වර්ෂයේදී, දෙවන වර්ෂයේදී හා තෙවන වර්ෂයේදී පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අනිවාර්ය පාඨමාලා ඒකක හැදෑරීම අත්‍යවශ්‍ය වේ.

### පාඨමාලා ඒකක ක්‍රමය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි බාහිර උපාධි පාඨමාලා සකස් කර ඇත්තේ පාඨමාලා ඒකක ක්‍රමයට අනුවය. එම පාඨමාලා ඒකක වර්ෂ පූර්ණ ඒවා වන අතර සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේදීම බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් අධ්‍යයන කාල සටහනක් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

## පාඨමාලා ඒකක කේත

සෑම පාඨමාලා ඒකකයක්ම හැඳින්වීම සඳහා ඉංග්‍රීසි කැපිටල් අක්ෂර හතරකින් සහ ඉලක්කම් පහකින් යුතු කේතයක් භාවිත කරනු ලැබේ. කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා භාවිත කරන කේතය මගින් එම පාඨමාලා ඒකකය අයත් වන අධ්‍යයන ක්ෂේත්‍රය, අධ්‍යයන වර්ෂය, පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය සහ එම පාඨමාලාවේ ඒකක අගය නිරූපණය වේ.

**STGE 1001.4 - මූලික ගණිතය**

| **STGE** | **1** | **001** | **.4** |
|---|---|---|---|
| අධ්‍යයන ක්ෂේත්‍රයේ කේතය | වර්ෂය | පාඨමාලා ඒකකයේ අනුක්‍රමික අංකය | ඒකක අගය |

## ඒකක අගය

පාඨමාලා ඒකකයක ඒකක අගය ශිෂ්‍ය සම්බන්ධීකරණ කාලය, ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ, අඛණ්ඩ ඇගයීම්, ප්‍රායෝගික පරීක්ෂණ, ක්ෂේත්‍ර අධ්‍යයන යනාදිය මත තීරණය කෙරේ. කිසියම් අපේක්ෂකයකු ආචාර්යවරයකුගේ සෘජු අධීක්ෂණය යටතේ ගත කරන අධ්‍යයන කාලය සහ ශිෂ්‍යයා විසින් ස්වයං අධ්‍යයන කටයුතු සඳහා යොදනු ලබන මූලික කාලය ද ඇතුලුව ශිෂ්‍ය සම්බන්ධීකරණ පැය ගණන අර්ථ දැක්වේ. ඒ අනුව එක් එක් පාඨමාලා ඒකක සඳහා නියමිත ශිෂ්‍ය සම්බන්ධීකරණ කාලය අදාළ විෂය නිර්දේශයන්හි සවිස්තරාත්මකව දක්වා ඇත.

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත්තේ අධ්‍යයන වර්ෂ තුනකදී සම්පූර්ණ කිරීම සඳහා ය. ඒ අනුව වසර තුනක් තුළ බෙදී යන ඒකක අගය 94 ක් වන පරිදි පාඨමාලා ඒකක 27 ක් (අනිවාර්ය විෂයය ඒකක ද ඇතුළුව) තෝරාගත යුතුය. පළමු වසර සඳහා ඒකක අගය 32 ක්, දෙවන වසර සඳහා ඒකක අගය 32 ක් (වැඩ පාදක පුහුණුව ද ඇතුලුව) සහ තෙවන වසර සඳහා ඒකක අගය 30 ක් වන පරිදි මෙම විෂය ඒකක තෝරා ගත යුතු ය.

## 5.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

### 5.1.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ව්‍යුහය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ව්‍යුහය සැකසී ඇත්තේ පාඨමාලා ඒකක ක්‍රමයට (Course Unit System) අනුවය. ඒ අනුව අදාළ විෂය ධාරාවට අයත් පාඨමාලා ඒකක 18 කින් සහ අනිවාර්ය පාඨමාලා ඒකක 8 කින් මෙය සමන්විත වේ. මෙම පාඨමාලා ඒකක වර්ෂ පූර්ණ ඒකක වන අතර ඒවාට අදාල විස්තර සවිස්තරාත්මක විෂය නිර්දේශයෙහි දක්වා තිබේ. අදාළ විෂය ධාරාවට අයත් පාඨමාලා ඒකක 18 තෝරා ගැනීමේදී 2021 ජනවාරි 15 දිනැති අංක 01/2021 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විෂය ගොනු ක්‍රමය යටතේ විෂයයන් තෝරා ගැනීම සිදු කළ යුතුය. ඒ අනුව ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාළ සියලුම විෂයයන් පහත දැක්වෙන පරිදි කාණ්ඩ (ගොනු) තුනකට වර්ග කර ඇත. විෂයයන් තෝරා ගැනීම සඳහා **www.external.sjp.ac.lk/reg** යන වෙබ් අඩවියට පිවිස එහි පළ කර ඇති අයදුම්පත සම්පූර්ණ කර මාර්ගගත ක්‍රමවේද ඔස්සේ යොමු කළ යුතුය. (මේ පිළිබඳ විස්තරාත්මක සටහනක් 24 පිටුවෙහි දැක්වේ)

**01 කාණ්ඩය**

**එක් විෂයක් පමණි**

- සිංහල
- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝවිද්‍යාව
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ඉතිහාසය

**02 කාණ්ඩය**

**විෂයයන් එකක් හෝ දෙකක් පමණි**

- සමාජ සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- පුරාවිද්‍යාව
- භූගෝල විද්‍යාව
- ජාත්‍යන්තර සම්බන්ධතා
- පාලි
- අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය

**03 කාණ්ඩය**

**එක් විෂයක් පමණි**

- මානව විද්‍යාව
- සංස්කෘත
- බෞද්ධ දර්ශනය
- සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය
- සංගීතය
- නාට්‍ය හා රංගකලාව
- නර්තනය
- දර්ශනය
- හින්දි
- බෞද්ධ ශිෂ්ටාචාරය
- ජපන්

### 5.1.2 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාළ පාඨමාලා ඒකක

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා අධ්‍යයනාංශ 15 ක් යටතේ විෂය ක්ෂේත්‍ර **27** කට අයත් පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

| | අධ්‍යයනාංශය | අධ්‍යයන ක්ෂේත්‍රය | කේතය |
|---|---|---|---|
| 1. | අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය | • අපරාධ විද්‍යාව | CRGE |
| 2. | ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | • ආර්ථික විද්‍යාව | ECGE |
| 3. | භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | • භූගෝල විද්‍යාව | GEGE |
| 4. | ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය | • ඉතිහාසය<br>• පුරාවිද්‍යාව | HIGE<br>ARGE |
| 5. | භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය | • නර්තනය<br>• නාට්‍ය හා රංග කලාව<br>• සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය<br>• සංස්කෘත<br>• හින්දි<br>• ජපන් | DAGE<br>DRGE<br>CUGE<br>SAGE<br>HNGE<br>JAGE |
| 6. | පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය | • පාලි<br>• බෞද්ධ ශිෂ්ටාචාරය<br>• බෞද්ධ දර්ශනය<br>• ශ්‍රී ලාංකේය සමාජය | PAGE<br>BCGE<br>BPGE<br>SOFT |
| 7. | දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය | • දර්ශනය<br>• මනෝවිද්‍යාව | PHGE<br>PSGE |
| 8. | දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය | • දේශපාලන විද්‍යාව<br>• ජාත්‍යන්තර සම්බන්ධතා | POGE<br>IRGE |
| 9. | සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය | • සිංහල<br>• ජනසන්නිවේදන | SIGE<br>CMGE |
| 10. | සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය | • සමාජ සංඛ්‍යානය | STGE |
| 11. | සමාජ විද්‍යා අධ්‍යයනාංශය | • සමාජ විද්‍යාව | SOGE |
| 12. | මානව විද්‍යා අධ්‍යයනාංශය | • මානව විද්‍යාව | ANGE |
| 13. | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය | • අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව | GENG |
| 14. | සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශය | • සංගීතය | MUGE |
| 15. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය | • තොරතුරු තාක්ෂණය | GEIT |

### 5.1.3 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ අනිවාර්ය පාඨමාලා ඒකක

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සෑම අපේක්ෂකයකුම තම අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අයත් පාඨමාලා ඒකකවලට අමතරව පළමු දෙවන හා තෙවන වසරවල පහත සඳහන් අනිවාර්ය පාඨමාලා ඒකක සමත්වීම අත්‍යවශ්‍ය වේ.

| වසර | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|---|
| පළමු වසර | GENG 1005.3 | English in use I | 3 |
| | GEIT 1001.3 | Introduction to Information and Communication Technology | 3 |
| | SOFT 1001.2 | ශ්‍රී ලාංකේය සමාජය | 2 |
| දෙවන වසර | GENG 2005.3 | English in use II | 3 |
| | GEIT 2001.3 | Microsoft Office for Workplace Productivity | 3 |
| | SOFT 2002.2 | නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | 2 |
| තෙවන වසර | GENG 3005.3 | English for General Purposes | 3 |
| | GEIT 3001.3 | Data Visualizations and Management | 3 |
| | GWBT 3001.3 | Work Based Training | 0 |

#### 5.1.3.1 වැඩ පාදක පුහුණුව (Work Based Training)

තෙවන වසර සඳහා නියමිත වැඩ පාදක පුහුණුව (Work Based Training) ඒකක අගයක් නොමැති අනිවාර්ය පාඨමාලා ඒකකයකි. ශ්‍රේණි ලකුණු සාමාන්‍යය ගණනය කිරීමේ දී මෙය අදාළ නොවූවත් උපාධි ප්‍රතිඵල ලේඛනයේ මෙම පාඨමාලාවට අදාළව උපයාගත් ශ්‍රේණිය සටහන් කරනු ලැබේ. විෂය නිර්දේශයේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව තෙවන වසරේ දී පැය 300 ක අවමයකට යටත්ව සම්පූර්ණ කළ යුතු ආයතනික පුහුණුවක් වන මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වන්නේ උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්ති විභවතාව වැඩි දියුණු කිරීම සඳහා යථාතත්වමය වැඩ පරිසරයක් තුළ සැළසුම් සහගත වෘත්තීය අත්දැකීම් තුළින් ප්‍රායෝගිකව වැඩ ඉගෙනීමට සැළැස්වීමයි.

විෂය ගොනු ක්‍රමය යටතේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා විෂයන් තෝරා ගැනීම ක්‍රමවේද දෙකක් යටතේ සිදු කළ හැකි අතර ඒ පිළිබඳව නිදර්ශනයක් පහත දක්වේ.

**ක්‍රමවේදය 01 - : විෂය කාණ්ඩ 03 න් එක් විෂය බැගින් විෂයයන් 03 ක් තෝරා ගැනීම.**

උදාහරණයක් ලෙස **පළමු කාණ්ඩයෙන් සිංහල ද , දෙවන කාණ්ඩයෙන් භූගෝල විද්‍යාව ද , තෙවන කාණ්ඩයෙන් මානව විද්‍යාව ද** තෝරා ගන්නේ නම්,

**01 කාණ්ඩය**

- **සිංහල** *
- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝවිද්‍යාව
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ඉතිහාසය

**02 කාණ්ඩය**

- සමාජ සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- පුරාවිද්‍යාව
- **භූගෝල විද්‍යාව** **
- ජාත්‍යන්තර සම්බන්ධතා
- පාලි
- අපරාධ විද්‍යාව

**03 කාණ්ඩය**

- **මානව විද්‍යාව** ***
- සංස්කෘත
- බෞද්ධ දර්ශනය
- සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය
- සංගීතය
- නාට්‍ය හා රංගකලාව
- නර්තනය
- දර්ශනය
- හින්දි
- බෞද්ධ ශිෂ්ටාචාරය
- ජපන්

**පොදු කාණ්ඩය**

- English in Use I
- English in Use II
- Introduction to Information & Communication Technology
- ශ්‍රී ලාංකේය සමාජය
- නායකත්වය හා පෞරුෂ සංවර්ධනය
- English for General Purposes
- Data Visualization & Management
- Microsoft Office for Workplace Productivity
- Work Based Training

**ප්‍රථම වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 1001.4<br>SIGE 1002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 1001.4<br>GEGE 1002.4 | 04<br>04 |
| මානව විද්‍යාව *** | ANGE 1001.4<br>ANGE 1002.4 | 04<br>04 |
| English In Use I | GENG 1005.3 | 03 |
| Introduction to Information & Communication Technology | GEIT 1001.3 | 03 |
| ශ්‍රී ලාංකේය සමාජය | SOFT 1001.2 | 02 |

**දෙවන වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 2001.4<br>SIGE 2002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 2001.4<br>GEGE 2002.4 | 04<br>04 |
| මානව විද්‍යාව *** | ANGE 2001.4<br>ANGE 2002.4 | 04<br>04 |
| English In Use II | GENG 2005.3 | 03 |
| නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | SOFT 2002.2 | 02 |
| Microsoft Office for Workplace Productivity | GEIT 2001.3 | 03 |

**තෙවන වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 3001.4<br>SIGE 3002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 3001.4<br>GEGE 3002.4 | 04<br>04 |
| මානව විද්‍යාව *** | ANGE 3001.4<br>ANGE 3002.4 | 04<br>04 |
| English for General Purposes | GENG 3005 | 03 |
| Data Visualization & Management | GEIT 3001 | 03 |
| Work Based Training | GWBT | 00 |

**ක්‍රමවේදය 02 - : 01 වන විෂය කාණ්ඩයෙන් එක් විෂයයක් හා 02 වන විෂය කාණ්ඩයෙන් විෂයයන් 02 ක් තෝරා ගැනීම.**

උදාහරණයක් ලෙස **පළමු කාණ්ඩයෙන් සිංහල ද , දෙවන කාණ්ඩයෙන් භූගෝල විද්‍යාව හා ජාත්‍යන්තර සම්බන්ධතා** තෝරා ගන්නේ නම්,

**01 කාණ්ඩය**

- **සිංහල** *
- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝවිද්‍යාව
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ඉතිහාසය

**02 කාණ්ඩය**

- සමාජ සංඛ්‍යානය
- ආර්ථික විද්‍යාව
- පුරාවිද්‍යාව
- **භූගෝල විද්‍යාව****
- **ජාත්‍යන්තර සම්බන්ධතා** ***
- පාලි
- අපරාධ විද්‍යාව

**03 කාණ්ඩය**

- **මානව විද්‍යාව**
- සංස්කෘත
- බෞද්ධ දර්ශනය
- සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය
- සංගීතය
- නාට්‍ය හා රංගකලාව
- නර්තනය
- දර්ශනය
- හින්දි
- බෞද්ධ ශිෂ්ටාචාරය
- ජපන්

**පොදු කාණ්ඩය**

- English in Use I
- English in Use II
- Introduction to Information & Communication Technology
- ශ්‍රී ලාංකේය සමාජය
- නායකත්වය හා පෞරුෂ සංවර්ධනය
- English for General Purposes
- Data Visualization & Management
- Microsoft Office for Workplace Productivity
- Work Based Training
-

**ප්‍රථම වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 1001.4<br>SIGE 1002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 1001.4<br>GEGE 1002.4 | 04<br>04 |
| ජාත්‍යන්තර සම්බන්ධතා *** | IRGE 1001.4<br>IRGE 1002.4 | 04<br>04 |
| English In Use I | GENG 1005.3 | 03 |
| Introduction to Information & Communication Technology | GEIT 1001.3 | 03 |
| ශ්‍රී ලාංකේය සමාජය | SOFT 1001.2 | 02 |

**දෙවන වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 2001.4<br>SIGE 2002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 2001.4<br>GEGE 2002.4 | 04<br>04 |
| ජාත්‍යන්තර සම්බන්ධතා *** | IRGE 2001.4<br>IRGE 2002.4 | 04<br>04 |
| English In Use II | GENG 2005.3 | 03 |
| Microsoft Office for Workplace Productivity | GEIT 2001.3 | 03 |
| නායකත්වය සහ පෞරුෂ සංවර්ධනය | SOFT 2002.2 | 02 |

**තෙවන වර්ෂය**

| විෂයය | කේතය | ඒකක අගය |
|---|---|---|
| සිංහල * | SIGE 3001.4<br>SIGE 3002.4 | 04<br>04 |
| භූගෝල විද්‍යාව ** | GEGE 3001.4<br>GEGE 3002.4 | 04<br>04 |
| ජාත්‍යන්තර සම්බන්ධතා *** | IRGE 3001.4<br>IRGE 3002.4 | 04<br>04 |
| English for General Purposes | GENG 3005 | 03 |
| Data Visualization & Management | GEIT 3001 | 03 |
| Work Based Training | GWBT | 00 |

## 5.1.4 අධ්‍යයනාංශ මගින් ඉදිරිපත් කරනු ලබන පාඨමාලා ඒකක

### (1) අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| CRGE 1001.4 | අපරාධ විද්‍යාවේ මූලික සංකල්ප | 04 |
| CRGE 1002.4 | අපරාධ යුක්ති ක්‍රමය | 04 |
| | **දෙවන වසර** | |
| CRGE 2001.4 | අපරාධ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම | 04 |
| CRGE 2002.4 | අපරාධ විද්‍යා න්‍යායයන් | 04 |
| | **තෙවන වසර** | |
| CRGE 3001.4 | සමකාලීන අපරාධ ප්‍රවණතා | 04 |
| CRGE 3002.4 | අපරාධ පාලනය හා නිවාරණය | 04 |

### (2) ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| ECGE 1001.4 | සූක්ෂ්ම ආර්ථික විද්‍යා මූලධර්ම | 04 |
| ECGE 1002.4 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | 04 |
| | **දෙවන වසර** | |
| ECGE 2001.4 | අන්තර්මධ්‍ය සූක්ෂ්ම ආර්ථික විද්‍යාව | 04 |
| ECGE 2002.4 | අන්තර්මධ්‍ය සාර්ව ආර්ථික විද්‍යාව | 04 |
| | **තෙවන වසර** | |
| ECGE 3001.4 | අධ්‍යතන ආර්ථික ගැටලු | 04 |
| ECGE 3002.4 | රාජ්‍ය ආර්ථික විද්‍යාව | 04 |

## (3) භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| GEGE 1001.4 | භූගෝල විද්‍යා චින්තනය හා ක්‍රමවේදය | 04 |
| GEGE 1002.4 | භෞතික හා මානව භූගෝල විද්‍යාව | 04 |
| | **දෙවන වසර** | |
| GEGE 2001.4 | සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප | 04 |
| GEGE 2002.4 | භෞතික පරිසරය හා පරිසර කළමනාකරණය | 04 |
| | **තෙවන වසර** | |
| GEGE 3001.4 | සංවර්ධනය හා සැලසුම්කරණය | 04 |
| GEGE 3002.4 | තුලනාත්මක ප්‍රාදේශීය අධ්‍යයනය | 04 |

## (4) ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය

### (i) ඉතිහාසය විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| HIGE 1001.4 | පෙරදිග ඉතිහාසයේ බලවේග | 04 |
| HIGE 1002.4 | අපරදිග ඉතිහාසයේ බලවේග | 04 |
| | **දෙවන වසර** | |
| HIGE 2001.4 | ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා) | 04 |
| HIGE 2002.4 | ඉන්දියා ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව.1200 දක්වා) | 04 |
| | **තෙවන වසර** | |
| HIGE 3001.4 | ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1948 දක්වා) | 04 |
| HIGE 3002.4 | යුරෝපා ඉතිහාසය (16 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වා) | 04 |

## (ii) පුරාවිද්‍යාව විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| ARGE 1001.4 | ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ඉතිහාසය | 04 |
| ARGE 1002.4 | සම්භාව්‍ය චිත්‍ර හා මූර්ති | 04 |
| | **දෙවන වසර** | |
| ARGE 2001.4 | පුරාවිද්‍යාවේ මූලධර්ම හා ක්ෂේත්‍ර පුරාවිද්‍යාව | 04 |
| ARGE 2002.4 | අභිලේඛන හා අක්ෂර රූප විද්‍යාව | 04 |
| | **තෙවන වසර** | |
| ARGE 3001.4 | සම්භාව්‍ය වාස්තු විද්‍යාව හා නාණක විද්‍යාව | 04 |
| ARGE 3002.4 | ස්මාරක සංරක්ෂණය හා පුරාවිද්‍යා උරුම කළමනාකරණය | 04 |

## (6) <u>සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශය</u>

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| | **පළමු වසර** | | |
| MUGE 1001.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික I (ගායනය) | 04 | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1002.4 | භාරතීය සංගීතය සිද්ධාන්ත හා ඉතිහාසය (ගායනය/වාදනය) | 04 | *MUGE 1001.4 හෝ MUGE 1003.4* |
| MUGE 1003.4 | හින්දුස්ථානි සංගීතය ප්‍රායෝගික I (වාදනය) (සිතාර්/ගිටාර්/වයලීන්/බටනලා/එස්රාජ්) | 04 | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |
| MUGE 1004.4 | North Indian Classical Music (Tabla) – Practical I | 04 | **නිපුණතා පරීක්ෂණයෙන් සමත්** |

| | | | |
|---|---|---|---|
| දෙවන වසර | | | |
| MUGE 2001.4 | උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය (ගායනය) - ප්‍රායෝගික II | 04 | *MUGE 1001.4* |
| MUGE 2002.4 | Western Music Theory | 04 | *MUGE 1001.4 හෝ 1002.4 හෝ 1003.4* |
| MUGE 2003.4 | උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය (වාදන) - ප්‍රායෝගික II | 04 | *MUGE 1003.4* |
| MUGE 2004.4 | North Indian Classical Music (Tabla) – Practical II | 04 | *MUGE 10044* |
| තෙවන වසර | | | |
| MUGE 3001.4 | උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය (ගායනය) ප්‍රායෝගික III | 04 | *MUGE 2001.4* |
| MUGE 3002.4 | රබීන්ද්‍ර සංගීතය හා ශ්‍රී ලාංකේය ජන සංගීතය | 04 | *MUGE 2002.4* |
| MUGE 3003.4 | උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය (වාදනය) ප්‍රායෝගික III | 04 | *MUGE 2003.4* |
| MUGE 3004.4 | North Indian Classical Music (Tabla) – Practical III | 04 | *MUGE 2004.4* |

## (7) භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය

### (i) නර්තනය විෂයයට අදාල පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| පළමු වසර | | | |
| DAGE 1001.4 | දේශීය නර්තන ඉතිහාසය හා සිද්ධාන්ත | 04 | නිපුණතා පරීක්ෂණයෙන් සමත් වීම (අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් හෝ අධ්‍යයනාංශය විසින් තීරණය කරනු ලබන නිර්ණායකයන්ට අනුව තෝරා ගැනීම සිදු කෙරේ) |
| DAGE 1002.4 | දේශීය නර්තන ප්‍රායෝගික I (උඩරට/ පහතරට/ සබරගමු) | 04 | |
| දෙවන වසර | | | |
| DAGE 2001.4 | භාරතීය නර්තන ඉතිහාසය හා සිද්ධාන්ත | 04 | |
| DAGE 2002.4 | නර්තන ප්‍රායෝගික II (උඩරට/ පහතරට/ සබරගමු) | 04 | DAGE 1002.4 |
| තෙවන වසර | | | |
| DAGE 3001.4 | ලෝක නර්තන සම්ප්‍රදායන් | 04 | |
| DAGE 3002.4 | නර්තන ප්‍රායෝගික III (උඩරට/ පහතරට/ සබරගමු) | 04 | DAGE 2002.4 |

## (ii) නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| DRGE 1001.4 | නාට්‍ය ප්‍රවේශය සහ ලෝකයේ පැරණි නාට්‍ය කලාව | 04 |
| DRGE 1002.4 | ශ්‍රී ලාංකේය නාට්‍ය කලාව | 04 |
| | **දෙවන වසර** | |
| DRGE 2001.4 | යුරෝපීය නාට්‍ය කලාව | 04 |
| DRGE 2002.4 | නූතන ශ්‍රී ලාංකික නාට්‍ය කලාව | 04 |
| | **තෙවන වසර** | |
| DRGE 3001.4 | නාට්‍ය නිර්මාණකරණය හා රංගභූමි ශිල්පය | 04 |
| DRGE 3002.4 | නාට්‍ය රචනය හා විචාරය | 04 |

## (iii) සංස්කෘත විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| SAGE 1001.4 | සංස්කෘත සාහිත්‍යය හා තදීය ඉතිහාසය | 04 |
| SAGE 1002.4 | සංස්කෘත ව්‍යාකරණය | 04 |
| | **දෙවන වසර** | |
| SAGE 2001.4 | සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යය හා සංස්කෘත භාෂා අධ්‍යයනය | 04 |
| SAGE 2002.4 | සංස්කෘත නාට්‍ය සාහිත්‍යය | 04 |
| | **තෙවන වසර** | |
| SAGE 3001.4 | වෛදික හා බෞද්ධ සංස්කෘත සාහිත්‍යය | 04 |
| SAGE 3002.4 | සංස්කෘත කාව්‍ය විචාරවාද හා භාෂා අධ්‍යයනය | 04 |

## (iv) හින්දි විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | කේතය |
|---|---|---|---|
| | | **පළමු වසර** | |
| HNGE 1001.4 | මූලික හින්දි ව්‍යාකරණ | 04 | නැත |
| HNGE 1002.4 | හින්දි සාහිත්‍ය ඉතිහාසය | 04 | නැත |
| | | **දෙවන වසර** | |
| HNGE 2001.4 | හින්දි ව්‍යාකරණ හා නිබන්ධ ලේඛනය | 04 | HNGE 1001.4 |
| HNGE 2002.4 | හින්දි ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය | 04 | HNGE 1001.4, 1002.4 |
| | | **තෙවන වසර** | |
| HNGE 3001.4 | හින්දි ඉතිහාසය හා පරිවර්තන කලාව | 04 | HNGE 1001.4, 1002.4, 2001.4, 2002.4 |
| HNGE 3002.4 | හින්දි ජන සාහිත්‍යය හා උත්තර භාරතීය සංස්කෘතිය | 04 | HNGE 1002.4, 2002.4 |

## (v) සංස්කෘතික අධ්‍යයනය විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| CUGE 1003.4 | සංස්කෘතික අධ්‍යයන ප්‍රවේශය | 04 |
| CUGE 1004.4 | සෞන්දර්ය අධ්‍යයන ප්‍රවේශය | 04 |
| | **දෙවන වසර** | |
| CUGE 2002.4 | ලෝක ආගම් හා සංස්කෘති | 04 |
| CUGE 2003.4 | භාෂාව හා සංස්කෘතිය | 04 |
| | **තෙවන වසර** | |
| CUGE 3001.4 | ශ්‍රී ලාංකේය ජන සම්ප්‍රදාය | 04 |
| CUGE 3002.4 | ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය | 04 |

### (vi) ජපන් විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| | පළමු වසර | | |
| JAGE 1001.4 | Introduction to Japanese Language | 04 | නැත |
| JAGE 1002.4 | Japanese Language and Culture | 04 | JAGE 1001.4 |
| | දෙවන වසර | | |
| JAGE 2001.4 | Communicative Japanese | 04 | JAGE 1002.4 |
| JAGE 2002.4 | Japanese Language and Lifestyle | 04 | JAGE 2001.4 |
| | තෙවන වසර | | |
| JAGE 3001.4 | Japanese for Business | 04 | JAGE 2002.4 |
| JAGE 3002.4 | Advanced Japanese Language Skills | 04 | JAGE 3001.4 |

## (8) පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

### (i) පාලි විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | පළමු වසර | |
| PAGE 1001.4 | පාලි භාෂා ප්‍රවේශය | 04 |
| PAGE 1002.4 | පාලි සාහිත්‍ය ප්‍රවේශය | 04 |
| | දෙවන වසර | |
| PAGE 2001.4 | පාලි සාහිත්‍ය ඉතිහාසය | 04 |
| PAGE 2002.4 | නිර්දිෂ්ට ග්‍රන්ථ | 04 |
| | තෙවන වසර | |
| PAGE 3001.4 | ව්‍යාකරණ හා වාග් විද්‍යාව | 04 |
| PAGE 3002.4 | අනිර්දිෂ්ට ග්‍රන්ථ හා ධර්ම විනය | 04 |

## (ii) බෞද්ධ ශිෂ්ටාචාරය විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | පළමු වසර | |
| BCGE 1001.4 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය සහ පරිහානිය | 04 |
| BCGE 1002.4 | මූලධර්ම අධ්‍යයනය | 04 |
| | දෙවන වසර | |
| BCGE 2001.4 | ශ්‍රී ලංකාවේ බෞද්ධ ශිෂ්ටාචාරය | 04 |
| BCGE 2002.4 | බෞද්ධ සමාජ දර්ශනය | 04 |
| | තෙවන වසර | |
| BCGE 3001.4 | බෞද්ධ සංස්ථා අධ්‍යයනය | 04 |
| BCGE 3002.4 | බෞද්ධ සාහිත්‍යය හා කලා ශිල්ප | 04 |

## (iii) බෞද්ධ දර්ශනය විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | පළමු වසර | |
| BPGE 1001.4 | බෞද්ධ දර්ශනය අධ්‍යයන ප්‍රවේශය | 04 |
| BPGE 1002.4 | ආදි බෞද්ධ දර්ශනය | 04 |
| | දෙවන වසර | |
| BPGE 2001.4 | බෞද්ධ දර්ශනයේ ඥාන විභාගය | 04 |
| BPGE 2002.4 | බෞද්ධ දර්ශන ඉතිහාසය | 04 |
| | තෙවන වසර | |
| BPGE 3001.4 | බෞද්ධ මනෝවිද්‍යාව හා ආචාර විද්‍යාව | 04 |
| BPGE 3002.4 | බුදු සමය හා සමාජ ගැටලු | 04 |

## (9) දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

### (i) දර්ශනය විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| PHGE 1001.4 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 04 |
| PHGE 1002.4 | දාර්ශනික ගැටලු | 04 |
| | **දෙවන වසර** | |
| PHGE 2001.4 | බටහිර දර්ශනය | 04 |
| PHGE 2002.4 | භාරතීය දර්ශනය | 04 |
| | **තෙවන වසර** | |
| PHGE 3001.4 | සාමාන්‍ය මනෝවිද්‍යාව | 04 |
| PHGE 3002.4 | ආචාර විද්‍යාව හා සමාජ දර්ශනය | 04 |

### (ii) මනෝ විද්‍යාව විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| PSGE 1001.4 | සාමාන්‍ය මනෝ විද්‍යාව | 04 |
| PSGE 1002.4 | ව්‍යවහාරික මනෝ විද්‍යාව | 04 |
| | **දෙවන වසර** | |
| PSGE 2001.4 | පෞරුෂ මනෝ විද්‍යාව | 04 |
| PSGE 2002.4 | මිනිස් හැසිරීමේ ස්වභාවය | 04 |
| | **තෙවන වසර** | |
| PSGE 3001.4 | ප්‍රජානන මනෝ විද්‍යාව | 04 |
| PSGE 3002.4 | කාර්මික මනෝ විද්‍යාව | 04 |

## (10) දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය

### (i) දේශපාලන විද්‍යාව විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| POGE 1001.4 | දේශපාලන විද්‍යාවේ මූලිකාංග | 04 |
| POGE 1002.4 | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය හා දේශපාලන වෙනස්වීම් | 04 |
| දෙවන වසර | | |
| POGE 2001.4 | දේශපාලන න්‍යාය | 04 |
| POGE 2002.4 | තුලනාත්මක දේශපාලනය හා ආණ්ඩුක්‍රමය | 04 |
| තෙවන වසර | | |
| POGE 3001.4 | දේශපාලන සමාජ විද්‍යාව | 04 |
| POGE 3002.4 | රාජ්‍ය පරිපාලනය | 04 |

### (ii) ජාත්‍යන්තර සම්බන්ධතා විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| පළමු වසර | | |
| IRGE 1001.4 | ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ හැඳින්වීමක් | 04 |
| IRGE 1002.4 | ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන | 04 |
| දෙවන වසර | | |
| IRGE 2001.4 | ජාත්‍යන්තර දේශපාලනය | 04 |
| HIGE 2002.4 | ගැටුම් හා ගැටුම් නිරාකරණය | 04 |
| තෙවන වසර | | |
| IRGE 3001.4 | ලෝක දේශපාලනයේ සමකාලීන අර්බුද | 04 |
| IRGE 3002.4 | ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය | 04 |

## (11) සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

### (i) සිංහල විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| SIGE 1001.4 | සාහිත්‍ය ප්‍රවේශය | 04 |
| SIGE 1002.4 | භාෂා ප්‍රවේශය | 04 |
| | **දෙවන වසර** | |
| SIGE 2001.4 | සිංහල භාෂාවේ ඉතිහාසය හා ව්‍යාකරණ සම්ප්‍රදාය | 04 |
| SIGE 2002.4 | සිංහල ප්‍රබන්ධ සාහිත්‍යය | 04 |
| | **තෙවන වසර** | |
| SIGE 3001.4 | සම්භාව්‍ය සිංහල සාහිත්‍යය | 04 |
| SIGE 3002.4 | ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා ජන සංස්කෘතිය | 04 |

### (ii) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයට අදාළ පාඨමාලා ඒකක

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| | **පළමු වසර** | | අ.පො.ස. (උ/පෙළ) පරීක්ෂණයට පෙනී සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය අංක 29 යටතේ එම විෂයයට ‘B’ හෝ ඉහළ සාමාර්ථයක් ලබා තිබිය යුතුය. |
| CMGE 1001.4 | සන්නිවේදන මූලධර්ම | 04 | |
| CMGE 1002.4 | මාධ්‍ය අධ්‍යයනය හැඳින්වීම | 04 | |
| | **දෙවන වසර** | | |
| CMGE 2001.4 | භාවිත සන්නිවේදනය | 04 | |
| CMGE 2002.4 | ජනමාධ්‍ය භාවිතය | 04 | |
| | **තෙවන වසර** | | |
| CMGE 3001.4 | වෘත්තීය සන්නිවේදනය | 04 | |
| CMGE 3002.4 | ජනසන්නිවේදය හා සමාජය | 04 | |

## (12) සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය | පූර්ව ආවශ්‍යකතා |
|---|---|---|---|
| | **පළමු වසර** | | |
| STGE 1001.4 | මූලික ගණිතය | 04 | නැත |
| STGE 1002.4 | මූලික සංඛ්‍යානය | 04 | නැත |
| | **දෙවන වසර** | | |
| STGE 2001.4 | සමාජීය විද්‍යාවන් සඳහා ගණිතය | 04 | STGE 2001.4 |
| STGE 2002.4 | සම්භාවිතා ව්‍යාප්ති සහ සංඛ්‍යාන අනුමිතිය | 04 | STGE 2002.4 |
| | **තෙවන වසර** | | |
| STGE 3001.4 | සමාජීය විද්‍යාවන් සඳහා සංඛ්‍යාන ක්‍රම | 04 | STGE 3001.4 |
| STGE 3002.4 | ප්‍රායෝගික සංඛ්‍යානය | 04 | STGE 3002.4 |

## (13) සමාජවිද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| SOGE 1001.4 | සමාජ විද්‍යා මූලික සංකල්ප | 04 |
| SOGE 1002.4 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | 04 |
| | **දෙවන වසර** | |
| SOGE 2001.4 | සමාජ විද්‍යා න්‍යාය | 04 |
| SOGE 2002.4 | ව්‍යවහාරික සමාජ විද්‍යාව | 04 |
| | **තෙවන වසර** | |
| SOGE 3001.4 | සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම | 04 |
| SOGE 3002.4 | ප්‍රජා සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාව | 04 |

## (14) මානව විද්‍යා අධ්‍යයනාංශය

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| ANGE 1001.4 | සංස්කෘතික මානව විද්‍යාව හැඳින්වීම | 04 |
| ANGE 1002.4 | භෞතික මානව විද්‍යාව හැඳින්වීම | 04 |
| | **දෙවන වසර** | |
| ANGE 2001.4 | මානවවිද්‍යා න්‍යාය | 04 |
| ANGE 2002.4 | ජනශ්‍රැති අධ්‍යයනය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමය | 04 |
| | **තෙවන වසර** | |
| ANGE 3001.4 | මානව විද්‍යාව පර්යේෂණ ක්‍රම | 04 |
| ANGE 3002.4 | ව්‍යවහාරික මානව විද්‍යාව හා සංවර්ධනය | 04 |

## 5.2 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

## Bachelor of Social Sciences (General) External Degree in Environmental and Development Studies

### හැඳින්වීම

පාරිසරික හා සංවර්ධන අධ්‍යයන පිළිබඳ සමාජීය විද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව මූලික වශයෙන් සංවර්ධනය වන ශ්‍රී ලංකාවේ මානව සම්පත් ප්‍රවර්ධනය අරමුණු කර ගත් එකකි. පරිසරය හා සංවර්ධනය වත්මන් ධරණීය සංවර්ධන ක්‍රියාදාමයේ තීරණාත්මක සාධක වී ඇති බැවින් දැනුම මුල්කරගත් සමාජ ආර්ථික ක්‍රමය තුළ එයට සුවිශේෂ ස්ථානයක් හිමි වෙයි. පශ්චාද් යුද සමය තුළ ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමයකට අවතීර්ණ වී සිටින ශ්‍රී ලංකාවට වර්තමානයේ වඩාත් ප්‍රශස්ත ලෙස මානව සම්පත් භාවිතයට ගැනීම උදෙසා නව ක්‍රමෝපායන් සෙවීමට සිදුවී තිබේ. මෙම පසුබිම තුළ පරිසරය හා සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක දැනුම ඵලදායී ලෙස භාවිතයට ගත හැකි කුසලතාවෙන් සපිරි උපාධිධරයන් බිහිකිරීමේ කාලීන අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් 2014 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකින් හඳුන්වා දෙනු ලබන සංවර්ධනය හා පරිසරය පිළිබඳ එකම බාහිර උපාධි පාඨමාලාව වන මෙය සංවර්ධනය සඳහා වඩාත් ඵලදායී ලෙස මානව සම්පත යොදා ගැනීමේ දිගුකාලීන අරමුණ ඉලක්ක කර ගනිමින් සකසා තිබේ. සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ විවිධ අංශයන්හි දිගුකාලීන සේවා පලපුරුද්ද ඇති වෘත්තිකයන් හට ද මෙම පාඨමාලාව හැදෑරීමේ අවකාශ සලසා ඇත්තේ උක්ත අරමුණ සාක්ෂාත් කරගනු පිණිසය. වඩාත් කාර්යක්ෂම වූ ඵලදායි සංවර්ධන ක්‍රියාවලියක නියමුවන් වශයෙන් ක්‍රියාකාරී මානව සම්පත් සංවර්ධනය කිරීම මෙම පාඨමාලාවේ ජාතික අභිලාෂය වේ. සංවර්ධනය සහ පරිසරය පිළිබඳ මූලික අවබෝධය ලබා දෙමින් විවිධ ක්ෂේත්‍රයන් තුළ එම දැනුම භාවිතයට ගැනීමේ හැකියාව ප්‍රගුණ කරවීමත් සංවර්ධන සැලසුම්කරණයේ දී හා ක්‍රියාවට නැංවීමේ දී ප්‍රාදේශීය සංවර්ධනය හා පාරිසරික තිරසර බව යන අංශ දෙකම සමෝධානය කිරීමට හැකි උපාධිධරයන් බිහිකිරීමත් මෙම පාඨමාලාවේ අපේක්ෂිත ඵලය වෙයි. ශිෂ්‍ය ප්‍රජාවගේ මෙන් ම පුළුල් සමාජයේ ද යහපත උදෙසා අතිශය යෝග්‍ය වූ ශිල්ප ක්‍රම ඔස්සේ න්‍යායාත්මක සහ ව්‍යවහාරික ඥාන විතරණය සඳහා කැපවීමත්, නිර්මාණශීලී හා බුද්ධිමය පදනමකින් යුක්ත නව මත ඉදිරිපත් කිරීමේ නිදහසකින් යුත් සම අවස්ථා සහ අධ්‍යාපනික දියුණුවක් ඇතිකරන පරිසරයක් තුළ ඉගැන්වීමත්, ඥාන ගවේෂණය සහ පර්යේෂණ මගින් අවකාශීය අධ්‍යයනයේ නියුතු විශිෂ්ටත්වයේ කේන්ද්‍රය ලෙස වර්ධනය වීමත්, සිය මෙහෙවර වශයෙන් සලකන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් මෙම පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ.

පරිසරය හා සංවර්ධනය සම්බන්ධ විෂයක්ෂේත්‍ර රැසකින් මෙහි පාඨමාලා ව්‍යූහය සැකසී තිබේ. මිනිස් සමාජය සහ භෞතික ලෝකය අතර පවත්නා සංකීර්ණ වූත් එකිනෙකට බැඳුණු හා පරස්පර වූත් සම්බන්ධතා සාර්ව ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමත්, සංවර්ධන ක්‍රියාවලියේ ගතිකත්වය හඳුනාගනිමින් න්‍යායාත්මක දැනුමත් ප්‍රායෝගික වශයෙන් භාවිතයට ගැනීම අරමුණු කරගත් පුළුල් විෂය පථයක් මෙම පාඨමාලාවට අයත් වේ.

ප්‍රථම වසර සඳහා පරිසරය හා සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක දැනුම ලබාදීම අරමුණු කරගත් පාඨමාලා ඉදිරිපත් කර ඇති අතර දෙවන වසරේදී ඒ හා සම්බන්ධ ක්‍රම ශිල්ප කෙරෙහි අවධානය යොමු කර ඇත. අවසන් වසර පාඨමාලා ඒකක සැකසී ඇත්තේ ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාවට නැංවීම අරමුණු කරගෙනය. ඉංග්‍රීසි භාෂාව, තොරතුරු තාක්‍ෂණය, කළමනාකරණ දැනුම සහ මෘදුක කුසලතා වර්ධනය උදෙසා ඉදිරිපත් කර ඇති පොදු විෂය ඒකක රාශියක් ද මෙම පාඨමාලාවට අන්තර්ගත වී තිබේ.

## පාඨමාලා ව්‍යුහය

| පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **පළමු වසර** | |
| GEDS 1104 | භෞතික පරිසරය | 04 |
| GEDS 1204 | මානව භූ දර්ශනය | 04 |
| GEDS 1304 | ආර්ථික කටයුතු සඳහා අවකාශීය සංවිධානය | 04 |
| GEDS 1404 | පරිසර විද්‍යාවේ මූලිකාංග | 04 |
| GEDS 1504 | සංවර්ධන මූලධර්ම | 04 |
| GEDS 1604 | ප්‍රාදේශීය සංවර්ධනය | 04 |
| ENGE 1703 | ඉංග්‍රීසි | 03 |
| SOSE 1803 | තොරතුරු තාක්ෂණය | 03 |

| පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **දෙවන වසර** | |
| GEDS 2104 | සංවර්ධන සැලසුම්කරණය සඳහා සිතියම් විද්‍යාව | 04 |
| GEDS 2204 | ආපදා කළමනාකරණය | 04 |
| GEDS 2304 | ග්‍රාමීය සංවර්ධනය සහ සැලසුම්කරණය | 04 |
| GEDS 2404 | ස්වාභාවික සම්පත් කළමනාකරණය | 04 |
| GEDS 2504 | සංවර්ධන අධ්‍යයන සඳහා සංඛ්‍යානය | 04 |
| GEDS 2604 | සමකාලීන සංවර්ධන ගැටලු | 04 |
| GEDS 2704 | ගෝලීය පරිසරය සහ දේශගුණ වෙනස්වීම් | 04 |
| GEDS 2803 | ඉංග්‍රීසි භාවිතය 11 | 03 |
| GEDS 2903 | නායකත්වය හා පෞරුෂ සංවර්ධනය | 03 |

| පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | ඒකක අගය |
|---|---|---|
| | **තෙවන වසර** | |
| GEDS 3104 | මානව සම්පත් සැලසුම්කරණය | 04 |
| GEDS 3204 | පාරිසරික ප්‍රතිපත්ති සහ නීති | 04 |
| GEDS 3304 | ව්‍යාපෘති සැලසුම්කරණය සහ ඇගයීම | 04 |
| GEDS 3404 | නාගරික සැලසුම්කරණය සහ සංවර්ධනය | 04 |
| GEDS 3504 | සංවර්ධන සැලසුම්කරණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධති | 04 |
| GEDS 3604 | ජල සම්පත් කළමනාකරණය | 04 |
| GEDS 3703 | වැඩ මූලික පුහුණුව | 03 |
| GEDS 3803 | සාමාන්‍ය භාවිතය සඳහා ඉංග්‍රීසි | 03 |
| | **මුළු ඒකක අගය** | **94** |

## 5.3 ශාස්ත්‍රවේදී ව්‍යවහාරික පොලිස් අධ්‍යයනය බාහිර උපාධි පාඨමාලාව
## Bachelor of Arts in Applied Police Studies External Degree

The Faculty of Humanities and Social Sciences (FHSS) of University of Sri Jayewardenepura together with the EDECU offer Bachelor of Arts Applied Police Studies external degree programme to cater the educational requirements of the policing service. This is a three-year undergraduate degree programme taught in English to give a career-oriented qualification with specifically designed multifaceted knowledge and skills to police officers.

The main objectives of the degree programme are as follows;

1. provide an updated theoretical and applied knowledge of policing and other related social sciences and humanities contents to accomplish duties and responsibilities effectively by demonstrating a broad array of intellectual, practical, and professional capabilities perceiving the changing roles and expectations of police.

2. make a compassionate, resilient, self-motivated, optimistic, persevering, and open to change police personnel who equipped with enhanced critical, analytical, and communication skills to analyze and understand multiple perspectives and issues encountered in the field to better serve individuals and communities.

3. make the police officers demonstrated appreciation for standards and ethics within all aspects of the policing process.

4. integrate policing theory, socioeconomic contents, research and policy demonstrating leadership, initiative and self- direction for professional development and life-long learning of the police.

..

**Programme Learning Outcomes**

On successful completion of Bachelor of Arts Applied Police Studies, graduates should be able to;

PLO 1 - enter the workplace with the theoretical and applied knowledge to accomplish one's own duties and responsibilities effectively.

PLO 2 - integrate policing theory, research and policy demonstrating leadership, initiative and self-direction for professional development and life-long learning.

PLO 3 - demonstrate a broad array of intellectual, practical and professional capabilities perceiving the changing roles and expectations of police in the context of a changing society.

PLO 4 - use critical, analytical, and communication skills to analyze and understand multiple perspectives and issues encountered in the field to better serve individuals and communities.

PLO 5 - model a way of working which is compassionate, resilient, self-motivated, optimistic, persevering, and open to change.

PLO 6 - demonstrate appreciation for standards and ethics within all aspects of the policing process.

Admission criteria: Passing of GCE A/L in any stream and three years of working experience in Sri Lanka police service.

Student intake: 150 students

SLQF Level: 5

Volume of work required for award of qualification:
Course work: 90 credits
Independent Research Report: 3 credits
Total: 93 credits

This is a three-year undergraduate program that consists of six semesters. A total of 30 course units will be equally distributed over six semesters along with students' research to be completed in the final semester of the program. Formative assessments will be conducted within the course while final examinations will be conducted at the end of each semester. The grading system applied in the Faculty of Humanities and Social Sciences

for its undergraduate study programs will be applied in this program while the degree is awarded after the successful completion of the entire three-year program subject to all the laws and by-laws of the university of Sri Jayewardenepura.

## Programme Structure:

| Semester | Course Code | Name of course unit | Credit Value | Status (Compulsory / Optional) |
|---|---|---|---|---|
| I | APS 1113 | English for Police | 3 | Compulsory |
| | APS 1123 | Introduction to Sociology and Its Applications | 3 | Compulsory |
| | APS 1133 | Anthropology | 3 | Compulsory |
| | APS 1143 | Introduction to Criminology and Criminal Justice | 3 | Compulsory |
| | APS 1153 | Peace Studies and National Security | 3 | Compulsory |
| | | | | |
| II | APS 1213 | English for Police II | 3 | Compulsory |
| | APS 1223 | Essentials of Economics | 3 | Compulsory |
| | APS 1233 | Practical Sinhala Writing | 3 | Compulsory |
| | APS 1243 | Victimology | 3 | Compulsory |
| | APS 1253 | Professional Ethics | 3 | Compulsory |
| | | | | |
| III | APS 2113 | Fundamentals of Information and Communication Technology | 3 | Compulsory |
| | APS 2123 | Public Administration and Public | 3 | Compulsory |
| | APS 2133 | Management | 3 | Compulsory |
| | APS 2143 | Conflict Resolution and International Relations | 3 | Compulsory |
| | APS 2153 | Crime Investigation Management | 3 | Compulsory |
| | APS 2163 | Structure of English | 3 | Compulsory |
| | | | | |

| Semester | Course Code | Name of course unit | Credit Value | Status (Compulsory / Optional) |
|---|---|---|---|---|
| IV | APS 2213 | Fundamentals of Cybersecurity | 3 | Compulsory |
| | APS 2223 | Heritage Management & Archaeology | 3 | Compulsory |
| | APS 2233 | Sri Lankan Economy and Contemporary Global Issues | 3 | Compulsory |
| | APS 2243 | Professional Values and Professional Development | 3 | Compulsory |
| | APS 2253 | Applied Police Management | 3 | Compulsory |
| | | | | |
| V | APS 3113 | Disaster Management | 3 | Compulsory |
| | APS 3123 | Meditation and Character Development | 3 | Compulsory |
| | APS 3133 | Community Participation & Social Work | 3 | Compulsory |
| | APS 3143 | Basic Statistics and Data Analysis | 3 | Compulsory |
| | APS 3153 | Advanced Writing Skills in English | 3 | Compulsory |
| | | | | |
| VI | APS 3213 | Geography of Sri Lanka | 3 | Compulsory |
| | APS 3223 | Tourist Hospitality Management and Destination Process | 3 | Compulsory |
| | APS 3233 | Human Recourse Management | 3 | Compulsory |
| | APS 3243 | Forensic Science | 3 | Compulsory |
| | APS 3253 | Research Methodology | 3 | Compulsory |

## 6. ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලිය

බාහිර උපාධි පාඨමාලා සඳහා නියමිත සියලුම පාඨමාලා ඒකක සඳහා අදාළ පාඨමාලාවට සම්බන්ධ ආචාර්යවරුන් විසින් ප්‍රතිපෝශක සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. සෑම බාහිර උපාධි පාඨමාලාවක එක් විෂය ඒකකයක් සඳහා පැය 40 ක කාලයක් දේශන හා ප්‍රායෝගික අභ්‍යාස පවත්වනු ලැබේ. ප්‍රායෝගික දේශන හැර සියලු දේශන මාර්ගගත ක්‍රමයට හෝ පටිගත කරන ලද වීඩියෝ පාඩම් වශයෙන් ඉදිරිපත් කෙරේ. මීට අමතරව එක් එක් පාඨමාලා ඒකකයන්ට අදාළව දැනුම පෝෂණය කර ගැනීම පිණිස ස්වයං අධ්‍යයනය සඳහා අවම වශයෙන් පැය 150 ක කාලයක් එක් එක් පාඨමාලා සඳහා වෙන් කළ යුතුය. මේ පිළිබඳව නිසි මාර්ගෝපදේශ අදාළ ආචාර්යවරයා විසින් දේශනවලදී දැනුවත් කරනු ලැබේ.

වර්තමානයේ දේශන ශාලාවලට කැඳවා සිසුන් අභිමුඛයෙහි සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවට විද්‍යුත් මාධ්‍ය උපයෝගී කරගනිමින් විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. එම ක්‍රමවේදයට අනුව විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පහත සඳහන් ආකාරයෙන් පවත්වනු ලැබේ.

1. සම්මන්ත්‍රණ වීඩියෝගත කර විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය හරහා (LMS) සිසුන් වෙත ලබා දීම.
2. සම්මන්ත්‍රණ පවත්වන අවස්ථාවේදී ම මාර්ගගත ක්‍රමයට (Online) සිසුන්ට ඊට සහභාගි වීමට අවස්ථාව සලසා දීම.

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් මෙහෙයවනු ලබන බාහිර උපාධි පාඨමාලාවලට අදාස ඒ ඒ විෂයයන්ට නියමිත විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වෙන ආකාරය පිළිබඳ තොරතුරු මෙන්ම සම්මන්ත්‍රණ පැවැත්වෙන දින සහ වේලාව සඳහන් සම්මන්ත්‍රණ කාල සටහන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කර කල් වේලා ඇතිව සිසුන් දැනුවත් කරනු ලැබේ.

## 7. ඇගයීම් ක්‍රමය

උපාධි පාඨමාලාවේ එක් එක් වර්ෂය සඳහා නියමිත ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අවසන් වූ පසුව අවසන් පරීක්ෂණ පවත්වනු ලැබේ. එක් එක් පාඨමාලාවට අදාළව ලිඛිත හෝ ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනු ලබන ආකාරය, පැය ගණන හා වෙනත් විස්තර සවිස්තරාත්මක විෂය නිර්දේශයන්හි දක්වා ඇති අතර අදාළ විෂය භාර ආචාර්යවරුන් විසින් ද මේ පිළිබඳව දැනුවත් කරනු ලැබේ. ඇතැම් පාඨමාලා සඳහා ඇගයීම් ක්‍රමය වශයෙන් වර්ෂාවසාන ලිඛිත හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් පමණක් පවත්වනු ලබන අතර ඇතැම් පාඨමාලා ඒකක සඳහා වර්ෂාවසාන පරීක්ෂණයට අමතරව අඛණ්ඩ ඇගයීමේ ක්‍රමයට අනුකූලව පැවරුම් ලබා දීම සිදු කෙරේ. එබඳු අවස්ථාවක දී අදාළ **පාඨමාලා ඒකකය සම්පූර්ණ කර ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා එම අවස්ථා දෙකම සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.**

## 7.1 අඛණ්ඩ ඇගයීම්

අඛණ්ඩ ඇගයීම් යන්නෙන් අදහස් වන්නේ අදාළ පාඨමාලා ඒකකයේ ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලිය ආරම්භයේ පටන් අවසන් පරීක්ෂණය පවත්වන තෙක් එක් ක්‍රමවේදයක් හෝ ක්‍රමවේද කිහිපයක් භාවිතයෙන් විෂය නිර්දේශයේ දක්වා ඇති ලකුණු සීමාවට අදාළව පවත්වනු ලබන ඇගයීමයි. මධ්‍ය අර්ධ වාර්ෂික පරීක්ෂණය/ ඉදිරිපත් කිරීම්/වාචික පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණ/ක්ෂේත්‍ර අධ්‍යයන හා සම්බන්ධ පැවරුම් හෝ වෙනත් නිර්දේශිත ක්‍රමයක් යන එකකින් හෝ කිහිපයකින් මෙය සමන්විත විය හැකිය. කිසියම් පාඨමාලා ඒකකයකට අයත් ඇගයීම් ලබාදීම හෝ ඇගයීම් පටිපාටිය පිළිබඳ දැනුවත් කිරීම අදාළ පාඨමාලා ඒකකය භාර ආචාර්යවරයා විසින් සිදු කරනු ලැබේ. අඛණ්ඩ ඇගයීම් සඳහා පහත නිර්ණායක අදාල වේ.

1. පළමු වරට පෙනී සිටින සිසුන්ට විෂය ඒකකට අදාළ පැවරුම් ලබා දී ඇත්නම් ඒවා සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ.
2. පුනර් අපේක්ෂකයන්ට අඛණ්ඩ ඇගයීම් සිදු කිරීම තම අභිමතය පරිදි සිදු කළ හැකි අතර යම් හේතුවක් නිසා අඛණ්ඩ ඇගයීම් සිදු නොකරන විභාග අපේක්ෂකයන්ට අඛණ්ඩ ඇගයීම්වලට වෙන් කළ ලකුණු හිමි නොවන අතර අවසන් පරීක්ෂණයේ ලකුණු පමණක් හිමි වේ. ඒ අනුව සමත්වීමට ලකුණු ප්‍රමාණවත් වන විට එම පාඨමාලා ඒකකය සමත් ලෙස සලකනු ලැබේ.

අදාළ ආචාර්යවරයාගේ උපදෙස් පරිදි එක් එක් පාඨමාලා ඒකකවලට අදාළ පැවරුම් නිසි පරිදි නියමිත දිනට පෙර භාරදීමේ වගකීම උපාධි අපේක්ෂකයන් විසින් දැරිය යුතු ය. එය පරීක්ෂණයේ කොටසක් බැවින් සියලුම විභාග නීතිරීති පැවරුම් සම්බන්ධයෙන් ද අදාළ වේ. ආචාර්යවරයා දැනුවත් කරන පරිදි බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට හෝ විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය (LMS) හරහා පැවරුම් නියමිත දිනට පෙර භාර දිය යුතුය. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට භාර දෙන්නේ නම් එසේ භාර දුන් බවට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයෙන් ලබාදෙන ලේඛනයේ අත්සන් තබා තහවුරු කරගත යුතුය. නියමිත දිනට භාර නොදෙන අඛණ්ඩ ඇගයීම් ප්‍රතික්ෂේප කෙරේ. අධ්‍යයනාංශය හෝ පාඨමාලා ඒකකය භාර ආචාර්යවරයා වග කියනු ලබන්නේ එකී නියමිත කාර්යය පටිපාටිය අනුගමනය කර අධ්‍යයනාංශය හෝ බාහිර විභාග අංශය වෙත භාරදෙනු ලබන පැවරුම් සම්බන්ධයෙන් පමණි.

## 7.2 අවසාන පරීක්ෂණය

සෑම පාඨමාලා ඒකකයක් සඳහාම අධ්‍යයන වර්ෂය අවසානයේදී පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එක් එක් පාඨමාලා ඒකකවල ආවශ්‍යකතාවන්ට අනුව අවසාන පරීක්ෂණවල කාලය වෙනස් විය හැකිය. සාමාන්‍යයෙන් අවසාන පරීක්ෂණය සඳහා නියමිත ප්‍රශ්න පත්‍රයට හිමි කාලය පැය තුනකි. අවසාන පරීක්ෂණය සඳහා අඛණ්ඩ ඇගයීම් නිර්දේශ කර නොමැති පාඨමාලාවක ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100% ක් හිමි වන අතර, අඛණ්ඩ ඇගයීම් නිර්දේශිත පාඨමාලාවක අවසාන පරීක්ෂණය සඳහා අදාළ පරිදි ලකුණු 60% - 80% ක් වශයෙන් හිමි වේ. ඒ අනුව අඛණ්ඩ ඇගයීම් සඳහා හිමිවන ලකුණු ප්‍රමාණය 20% - 40% ත් අතර විය හැකි වන අතර එහි නිශ්චිත ප්‍රතිශතය අදාළ ආචාර්යවරයා විසින් තීරණය කෙරෙනු ඇත.

## 8. ශ්‍රේණි පටිපාටිය සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA)

සියලුම බාහිර උපාධි පාඨමාලාවන්හි ඇගයීම් ක්‍රියාවලියේ දී පහත වගුවේ දැක්වෙන පරිදි ශ්‍රේණි අක්ෂර සහ සංකේත භාවිත කරනු ලැබේ. ශ්‍රේණි ලකුණු සාමාන්‍යය යනු කිසියම් බාහිර උපාධි අපේක්ෂකයකු තම උපාධි පාඨමාලාව තුළදී සම්පූර්ණ කරන ලද පාඨමාලා ඒකක සඳහා ලබා ගත් ශ්‍රේණිවලට ආරෝපණය කරනු ලබන ලකුණු එම ඒකකයන්ගේ ඒකක අගයෙන් බර තැබීම මගින් ගණනය කරනු ලබන සාමාන්‍ය අගයයි.

- E ශ්‍රේණිය සහ AB රහිත GPA අගය 2.00ට වැඩි නම් සමත් ලෙස සලකනු ලැබේ.
- GPA අගය 2.00ට අඩු නම් අසමත් ලෙස සලකනු ලැබේ.

<table>
<tr><th>ලකුණු</th><th>ශ්‍රේණි/ සංකේත</th><th>ඒකක අගය</th><th>විස්තරය</th></tr>
<tr><td>85 -100</td><td>A+</td><td>4.00</td><td rowspan="2">විශිෂ්ටයි</td></tr>
<tr><td>70 - 84</td><td>A</td><td>4.00</td></tr>
<tr><td>65 - 69</td><td>A-</td><td>3.70</td><td rowspan="3">හොඳයි</td></tr>
<tr><td>60 - 64</td><td>B+</td><td>3.30</td></tr>
<tr><td>55 - 59</td><td>B</td><td>3.00</td></tr>
<tr><td>50 - 54</td><td>B-</td><td>2.70</td><td rowspan="3">සතුටුදායකයි</td></tr>
<tr><td>45 - 49</td><td>C+</td><td>2.30</td></tr>
<tr><td>40 - 44</td><td>C</td><td>2.00</td></tr>
<tr><td>35 - 39</td><td>C-</td><td>1.70</td><td rowspan="4">අසතුටුදායකයි</td></tr>
<tr><td>30 - 34</td><td>D+</td><td>1.30</td></tr>
<tr><td>25 - 29</td><td>D</td><td>1.00</td></tr>
<tr><td>0 - 24</td><td>E</td><td>0.00</td></tr>
<tr><td rowspan="2">-</td><td>AB</td><td rowspan="4">අදාළ නොවේ</td><td>නොපැමිණි</td></tr>
<tr><td>EXL</td><td>බැහැර කළ</td></tr>
<tr><td>-</td><td>DFR</td><td>කල් දැමූ</td></tr>
<tr><td>-</td><td>MC</td><td>වෛද්‍ය හේතු මත පෙනී නොසිටි</td></tr>
</table>

## 8.1 ශ්‍රේණි ලකුණු ගණනය කරන ආකාරය

**උදාහරණය - ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ලබා ගත් ශ්‍රේණිය | උපයා ගත් ශ්‍රේණි ලකුණු | ඒකක අගය | උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම |
|---|---|---|---|---|---|
| BCGE 1001.4 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය හා පරිහානිය | **B** | 3.00 | 4 | 12 |
| BCGE 1002.4 | මූලධර්ම අධ්‍යයනය | **B** | 3.00 | 4 | 12 |
| ECGE 1001.4 | සූක්ෂ්ම ආර්ථික විද්‍යා මූලධර්ම | **A+** | 4.00 | 4 | 16 |
| ECGE 1002.4 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | **A -** | 3.70 | 4 | 14.8 |
| SOGE 1001.4 | සමාජවිද්‍යා මූලික සංකල්ප | **B+** | 3.30 | 4 | 13.2 |
| SOGE 1002.4 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | **C** | 2.00 | 4 | 08 |
| GENG 1005.3 | English in Use I | **C** | 2.00 | 3 | 06 |
| GEIT 1001.3 | Introduction to Information and Commiunication Technology | **C** | 2.00 | 3 | 06 |
| SOFT 1001.2 | ශ්‍රී ලාංකේය සමාජය | **C** | 2.00 | 2 | 04 |
| එකතුව | | | | 32 | 92 |

$$GPA = \frac{\sum_{i=1}^{N} \left[(\text{ඒකක අගය})_i * (\text{උපයාගත් ශ්‍රේණි ලකුණ})_i\right]}{\sum_{i=1}^{N} (\text{ඒකක අගය})_i}$$

$$GPA = \frac{\text{උපයා ගත් ශ්‍රේණී ලකුණු වටිනාකම් එකතුව}}{\text{ඒකක අගය එකතුව}} = \frac{92}{32} = 2.875$$

මෙම උදාහරණයට අනුව උපාධියෙහි අවසන් ශ්‍රේණි ලකුණු අගය වන්නේ 2.87 කි. ඒ අනුව මෙම සිසුවා සමත් වේ.

## 8.2 අවසන් ශ්‍රේණි ලකුණු ගණනය කළ විට අසමත් ශ්‍රේණි අගයන් දක්වන උදාහරණයක් පහත දැක්වේ

| කේතය | පාඨමාලා ඒකකයේ නම | ලබා ගත් ශ්‍රේණිය | උපයා ගත් ශ්‍රේණි ලකුණු | ඒකක අගය | උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම |
|---|---|---|---|---|---|
| BCGE 1001.4 | භාරතීය බෞද්ධ ශිෂ්ටාචාරයෙහි ප්‍රභවය හා පරිහානිය | **C** | 2.00 | 4 | 08 |
| BCGE 1002.4 | මූලධර්ම අධ්‍යයනය | **C** | 2.00 | 4 | 08 |
| ECGE 1001.4 | සූක්ෂ්ම ආර්ථික විද්‍යා මූලධර්ම | **D** | 1.00 | 4 | 04 |
| ECGE 1002.4 | සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම | **C -** | 1.70 | 4 | 6.8 |
| SOGE 1001.4 | සමාජවිද්‍යා මූලික සංකල්ප | **C+** | 2.30 | 4 | 9.2 |
| SOGE 1002.4 | සමකාලීන සමාජය හා සමාජ වෙනස්වීම | **C** | 2.00 | 4 | 08 |
| GENG 1005.3 | English in Use I | **C** | 2.00 | 3 | 06 |
| GEIT 1001.3 | Introduction to Information and Commiunication Technology | **C** | 2.00 | 3 | 06 |
| SOFT 1001.2 | ශ්‍රී ලාංකේය සමාජය | **C** | 2.00 | 2 | 04 |
| එකතුව | | | | 32 | 60 |

$$GPA = \frac{\sum_{i=1}^{N} \left[ (\text{ඒකක අගය})_i * (\text{උපයාගත් ශ්‍රේණි ලකුණු})_i \right]}{\sum_{i=1}^{N} (\text{ඒකක අගය})_i}$$

$$GPA = \frac{\text{උපයා ගත් ශ්‍රේණි ලකුණු වටිනාකම් එකතුව}}{\text{ඒකක අගය එකතුව}} = \frac{60}{32} = 1.875$$

මෙම උදාහරණයට අනුව උපාධියෙහි අවසන් ශ්‍රේණි ලකුණු අගය වන්නේ 1.87 කි. ඒ අනුව මෙම සිසුවා අසමත් වේ.

# 9. විභාග නිර්ණායක (GPA) සහ උපාධි ආවශ්‍යකතා

## 9.1 විභාග නිර්ණායක

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් ඔවුන් ලියාපදිංචි වී ඇති පාඨමාලාවට අදාළ ආවශ්‍යකතා සපුරාලිය යුතු අතර සතුටුදායක අධ්‍යයන ප්‍රගතියක් ද පෙන්නුම් කළ යුතු වේ. මේ සඳහා අදාළ වන විභාග නිර්ණායක පහත අංක යටතේ දැක්වේ.

## 9.2 පාඨමාලා ඒකකයක් සමත් වීම

උපාධි අපේක්ෂකයකු කිසියම් පාඨමාලා ඒකකයකින් C හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලබා ඇත්නම් එම පාඨමාලා ඒකකයෙන් සමත් ලෙස සැලකෙන අතර D, D+ සහ C- යන ශ්‍රේණි ඌන සාමර්ථ්‍යය ශ්‍රේණි ලෙස සැලකේ.

උපාධි අපේක්ෂකයකු කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා E, AB සහ FAIL ශ්‍රේණි ලබා ඇත්නම් එම පාඨමාලා ඒකකය අසමත් යැයි සැලකේ. උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට එලෙස අසමත් වන සියලු පාඨමාලා ඒකක සමත් වීම අනිවාර්ය වේ.

## 9.3 වර්ෂ අවසාන විභාගයට පෙනී නොසිටීමට හේතු වාර්තා කිරීම

යම් බාහිර උපාධි පාඨමාලාවක පරීක්ෂණයකට ප්‍රථම වරට පෙනී සිටින අපේක්ෂකයෙකුට 9.4 හි සඳහන් කරුණු යටතේ සම්පූර්ණ පරීක්ෂණයකට හෝ පරීක්ෂණයේ විෂය ඒකකයකට/ ඒකකයන් කිහිපයකට පෙනී සිටීමට නොහැකි වුවහොත් පරීක්ෂණයට පෙනී නොසිටීමට පිළිගත් හේතු සහිත අදාළ ලේඛන දී ඇති උපදෙස් පරිදි ඉදිරිපත් කළ හැකිය.

උපාධි අපේක්‍ෂකයා බරපතළ ලෙස රෝගාතුර වීම, උපාධි අපේක්ෂකයාගේ මව, පියා, දරුවන්, කලත්‍රයා, සහෝදර සහෝදරියන්ගේ අභාවය, උපාධි අපේක්ෂකයාගේ විවාහය හෝ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් හේතුවක් පරීක්‍ෂණ සඳහා පෙනී නොසිටීමට පිළිගත හැකි හේතුවක් වේ. අවසාන විභාගයට පෙනී නොසිටීමට බලපාන හේතු පහත සංකේතයන්ගෙන් දැක්වේ.

- වෛද්‍ය හේතු මත විභාගයට පෙනී නොසිටීම MC
- පිළිගත හැකි හේතු මත විභාගයට පෙනී නොසිට කල් ගැනීම WP
- පිළිගත හැකි හේතුවක් නොමැතිව විභාගයට පෙනී නොසිටීම AB (මෙම තත්ත්වය පාඨමාලා ඒකකය අසමත් වීමක් ලෙස සලකනු ලැබේ.)
- පාඨමාලාවෙන් බැහැර කළ අවස්ථාවේදී WP

එබඳු අවස්ථාවක දී අදාළ ප්‍රශ්න පත්‍රය සඳහා **විභාගය පැවැත්වෙන දින සිට දින 14ක් ඇතුළත රජයේ රෝහලකින් ලබා ගත් වෛද්‍ය සහතිකයක් සමග අප වෙබ් අඩවියෙහි http://external.sjp.ac.lk/examination-rules-and-regulations/** යටතේ ඇති **Absence Justification අයදුම්පත ද සහිතව බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ඉදිරිපත් කර විභාගය සඳහා පෙනී නොසිටීමට හේතුව තහවුරු කළ යුතුය.**

වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ රජයේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෛද්‍යවරයකුගෙන් නම් එය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී මගින් සහතික කරවා ගත යුතු අතර, වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ **ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් නම් එය ආයුර්වේද රෝහලක වෛද්‍ය නිලධාරියකු මගින් සහතික කරවා ගත යුතුය.**

උපාධි අපේක්ෂකයාගේ විවාහය, විදේශගත වීම, පවුලේ ළඟම සාමාජිකයකුගේ අභාවයකදී ඊට අදාළ වන විභාගයට පෙනී නොසිටීම සනාථ කිරීමට වලංගු ලේඛන (විවාහ සහතික, වීසා බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර, පවුලේ ළඟම සාමාජිකයෙකුගේ අභාවයකදී නිසි පරිදි සහතික කළ මරණ සහතිකයක් ඥාතිත්වය තහවුරු කිරීමේ සහතික) හෝ පිළිගත් වෛද්‍ය සහතික බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය. (අවමංගල්‍ය ශෝක ප්‍රකාශ මරණ සහතික ලෙස පිළිගනු නොලැබේ.)

එසේ ඉදිරිපත් කරන ලේඛන මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශයෙන් පසුව සනාතන සභාව විසින් අනුමත කළ යුතුය. වෛද්‍ය සහතිකය පිළිගත හැකි එකක් නම් පාඨමාලා ඒකකය සඳහා උපාධි අපේක්ෂකයාට ප්‍රතිඵල ලේඛනයේ MC සංකේතය ලැබේ. MC හිමිකම ලැබූ අපේක්ෂකයාට ප්‍රථම වරට පෙනී සිටීමට නොහැකි වූ පරීක්ෂණයේ පුනර් පරීක්ෂණය පවත්වන අනුයාත වර්ෂයේදී වරප්‍රසාද සහිතව පෙනී සිටිය හැකිය. MC සංකේතය ලැබීමෙන් විභාග ගාස්තු නිදහස් කිරීමක් සිදු නොවේ. ඒ අනුව මුදල් ගෙවා පරීක්ෂණ අයදුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එහිදී විභාග අපේක්ෂකයා විසින් උපයාගත් මුළු ලකුණු ප්‍රමාණය හිමිවේ.

ඉහත සඳහන් පරිදි සම්පූර්ණ පරීක්ෂණයකට හෝ පරීක්ෂණයේ විෂයකට/විෂයයන් කිහිපයකට ප්‍රථම වරට පෙනී සිටීමට නොහැකිව MC හිමිකම ලැබුවේ නම් ප්‍රථම වරට පෙනී සිටීමට නොහැකි වූ පරීක්ෂණයේ පුනර් පරීක්ෂණය පවත්වන අනුයාත වර්ෂයේදී ද පුනර් පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වුවහොත් නැවත වරක් 9.4 හි සඳහන් පරිදි පරීක්ෂණයට පෙනී නොසිටීමට පිළිගත් හේතු ඉදිරිපත් කළ හැකිය. විභාග නිර්ණායක අනුව MC හිමිකම අනුමත වනුයේ ප්‍රථම වරට පෙනී සිටින පරීක්ෂණයට සහ MC හිමිකම ලැබූ අනුයාත පුනර් පරීක්ෂණයකට පමණි. ඒ අනුව සම්පූර්ණ පරීක්ෂණයකට හෝ පරීක්ෂණයේ විෂය ඒකකයකට/ඒකකයයන් කිහිපයකට MC හිමිකම ලැබෙනුයේ උපරිම අවස්ථා දෙකක් පමණි.

**උදාහරණය 01-**

2021 අධ්‍යයන වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණයේ සම්පූර්ණ පරීක්ෂණයටම පෙනී සිටීමට නොහැකිව පිළිගත හැකි හේතු ඉදිරිපත් කර MC හිමිකම ලැබුවේ නම් 2021 අධ්‍යයන වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණයට ප්‍රථම වරට පෙනී සිටින අයෙකු ලෙස වරප්‍රසාදය හිමිවේ.

**උදාහරණය 02-**

2021 අධ්‍යයන වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණයේ SIGE 1001 විෂය ඒකකයට පෙනී සිටීමට නොහැකිව පිළිගත හැකි හේතු ඉදිරිපත් කර MC හිමිකම ලැබුවේ නම් සහ 2021 අධ්‍යයන වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණයේ SIGE 1001 විෂය ඒකකයට පෙනී සිටීමට නොහැකිවූයේ නම් නැවත වරක් පරීක්ෂණයට පෙනී නොසිටීමට පිළිගත් හේතු ඉදිරිපත් කර MC හිමිකම දෙවන වරටත් ලබා ගත හැකිය.

## 9.4 පුනර් පරීක්ෂණ

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලයේ සහ පීඨ මණ්ඩලයේ නිර්දේශයෙන් පසුව සනාතන සභාව අනුමත කරනු ලබන විශේෂ තත්ත්වයකදී හැර E ශ්‍රේණියක් සහිතව පාඨමාලා ඒකකයකට පෙනී සිටින උපාධි අපේක්ෂකයන් එම ඒකකය සඳහා නැවත පරීක්‍ෂණයක් පවත්වනු ලබන ප්‍රථම අවස්ථාවේදීම එයට පෙනී සිටිය යුතුය. උපාධි අපේක්ෂකයකු D, D+, C- යන ශ්‍රේණි ලබා ඇති අවස්ථාවක දී එම පාඨමාලාව සඳහා විභාගය නැවත පැවැත්වෙන ප්‍රථම අවස්ථාවේ දී නැවත පෙනී සිටිය හැකිය.

පාඨමාලා ඒකකයකින් අසමත්ව නැවත පෙනී සිටින අපේක්ෂකයකුට ලබා ගත හැකි උපරිම ශ්‍රේණිය C වේ. පුනර් පරීක්ෂණයකදී කලින් ලබා ගත් ශ්‍රේණියට වඩා අඩු ශ්‍රේණියක් ලබා ගෙන ඇති අවස්ථාවකදී කලින් ලබා ගෙන ඇති ඉහළම ශ්‍රේණිය උපාධි අපේක්ෂකයාට හිමි වේ. එමෙන්ම යම් විෂය ඒකකයකට පරීක්ෂණය පවත්වන ප්‍රථම අවස්ථාවේ අයදුම් කර පෙනී නොසිටියේ නම් සහ අයදුම් නොකර සිටියේ නම් අදාළ විෂය ඒකකයට නැවත පෙනී සිට ලබා ගත හැකි උපරිම ශ්‍රේණිය C වේ.

### 9.5 උපාධි ආවශ්‍යකතා

බාහිර උපාධිය ලබා ගැනීම සඳහා පහත සඳහන් ආවශ්‍යකතා සියල්ල සම්පූර්ණ කළ යුතුය.

(i) ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය ලබා ගැනීම සඳහා අවම වශයෙන් ඒකක අගය 94 ක් වන පරිදි පාඨමාලා ඒකක සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතුය.

(ii) සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා අවම වශයෙන් ඒකක අගය 94 ක් වන පරිදි පාඨමාලා ඒකක සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතුය.

(iii) එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා අවම වශයෙන් 2.00 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය

(iv) සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා අවම වශයෙන් 2.00 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.

(v) අසමත් ශ්‍රේණිය (E) සහ විභාගයට පෙනී නො සිටීමේ සංකේතය (AB) නො තිබිය යුතුය.

## 10. පන්ති සාමර්ථ්‍යය ප්‍රදානය

බාහිර උපාධි පාඨමාලා සඳහා පන්ති සාමර්ථ්‍යය ලැබීමේ ආවශ්‍යකතා පහත දැක්වේ.

### 10.1 පළමු පෙළ පන්ති සාමර්ථ්‍යය

පළමු පෙළ පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා පහත සඳහන් ආවශ්‍යකතා සියල්ල සම්පූර්ණ කළ යුතුවේ.

- මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා අවම වශයෙන් 2.00 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා 3.70 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නො සීටීමේ සංකේතය (AB) නො තිබිය යුතුය.
- වැඩ පාදක පුහුණුව (Work Based Training) ඇතුළත්ව අනිවාර්ය විෂය ඒකක සියල්ල සමත් විය යුතුය. (C ශ්‍රේණිය හෝ ඉහළ සාමර්ථ්‍යයක් ලැබිය යුතුය.)
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා C ශ්‍රේණියට පහළ ශ්‍රේණි නො තිබිය යුතු ය.
- සමස්ත උපාධි පාඨමාලාවට අදාළ විෂය ඒකකයන්ගෙන් අඩකටවත් අවම වශයෙන් A හෝ ඊට ඉහළ සාමර්ථ්‍ය උපයාගෙන තිබිය යුතුය.

## 10.2 දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යය

දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා පහත සඳහන් ආවශ්‍යකතා සියල්ල සම්පූර්ණ කළ යුතුවේ.

- මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා අවම වශයෙන් 2.00 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා 3.30 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නො සිටීමේ සංකේතය (AB) නො තිබිය යුතුය.
- වැඩ පාදක පුහුණුව (Work Based Training) ඇතුළත්ව අනිවාර්ය විෂය ඒකක සියල්ල සමත් විය යුතුය. (C ශ්‍රේණිය හෝ ඉහළ සාමර්ථ්‍යයක් ලැබිය යුතුය.)

## 10.3 දෙවන පෙළ (පහළ) පන්ති සාමර්ථ්‍යය

දෙවන පෙළ (පහළ) පන්ති සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා පහත සඳහන් ආවශ්‍යකතා සියල්ල සම්පූර්ණ කළ යුතුවේ.

- මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව පිළිගත හැකි වලංගු හේතුවක් ඇති අවස්ථාවකදී හැර පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඇතුළත උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා අවම වශයෙන් 2.00 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා 3.00 ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නො සීටීමේ සංකේතය (AB) නො තිබිය යුතුය.
- වැඩ පාදක පුහුණුව (Work Based Training) ඇතුළත්ව අනිවාර්ය විෂය ඒකක සියල්ල සමත් විය යුතුය. (C ශ්‍රේණිය හෝ ඉහළ සාමාර්ථ්‍යයක් ලැබිය යුතුය.)

### 10.4 සාමාන්‍ය සාමර්ථ්‍යය

සාමාන්‍ය සාමර්ථ්‍යයක් ප්‍රදානය කිරීම සඳහා පහත සඳහන් ආවශ්‍යකතා සියල්ල සම්පූර්ණ කළ යුතුවේ.

- එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා අවම වශයෙන් **2.00** ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා **2.00** ට නො අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) තිබිය යුතුය.
- අසමත් ශ්‍රේණිය E සහ විභාගයට පෙනී නො සිටීමේ සංකේතය (AB) නො තිබිය යුතුය.
- වැඩ පාදක පුහුණුව (Work Based Training) ඇතුළත්ව අනිවාර්ය විෂය ඒකක සියල්ල සමත් විය යුතුය. (C ශ්‍රේණිය හෝ ඉහළ සාමර්ථ්‍යයක් ලැබිය යුතුය.)

### 10.5 පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය

පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය සඳහා කැමැත්තක් දක්වන සිසුන් විභාග ප්‍රතිඵල නිකුත් කර දින **14** ක් ඇතුළත Student Profile මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

## 11. විභාග අක්‍රමිකතා

බාහිර විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයන් සඳහා ද අභ්‍යන්තර සිසුන්ට අදාළ විභාග අක්‍රමිකතා පිළිබඳව පවතින විනය පටිපාටිය එලෙසින්ම ක්‍රියාත්මක වේ. විභාග ශාලාව තුළ විනය පවත්වාගෙන යාම සඳහා සෑම අපේක්ෂකයකුම සහාය විය යුතු වේ. පහත දක්වා ඇති විභාග අක්‍රමිකතා සිදුකිරීම බලවත් වරදක් වන අතර එවැනි විෂමාචාර ක්‍රියාවක යෙදුනහොත් විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පවත්වනු ලබන දඬුවම්වලට අපේක්ෂකයන් යටත්වනු ඇත. සියලු විභාග වලට පෙනී සිටින අපේක්ෂකයින් සඳහා විභාග පැවැත්වීමේ පටිපාටිය, විභාග අක්‍රමිකතා සහ දඬුවම් පිළිබඳ නීතිරීති සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 292 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද ලේඛනය **www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියේ පළකර ඇත.

## 11.1 විභාග අක්‍රමිකතා ලෙස සැලකෙන කරුණු

- සෙලියුලර් දුරකථන හෝ වෙනත් සන්නිවේදන උපකරණ පිළිතුරු ලියන අවස්ථාවේ ළඟ තබා ගැනීම සහ භාවිත කිරීම.
- ලිපිලේඛන සහ බල නො ලත් වෙනත් ලේඛන සන්තකයේ තබා ගැනීම.
- විභාග ශාලාවේ දී විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා ලේඛන ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම.
- පිළිතුරු ලිවීම සඳහා වෙනත් අයගෙන් උදව් ලබා ගැනීම.
- විභාග අපේක්ෂකයකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම.
- ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැන ගැනීමට තැත් කිරීම.
- විභාග සම්බන්ධ යම් වරදක් කිරීමට ආධාර අනුබල ලබාදීම හා ලබා ගැනීම.
- අවසරයකින් තොරව විභාග ශාලාවෙන් පිටවීම හෝ ඒ සඳහා තැත් කිරීම හෝ අනුබල දීම.
- කිසිඳු කඩදාසියක් හෝ ලියන පොතක් ඉරීම, පොඩි කිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර
- දැමීම හෝ ඒ සඳහා තැත් කිරීම හෝ ඊට අනුබල දීම.
- විභාග ශාලාධිපතිට, නිරීක්ෂකවරුන්ට හෝ අනෙකුත් විභාග නිලධාරීන්ට බලපෑම් කිරීම.
- අසංවර හැසිරීම්, අනිසි බලපෑම් හා වෙනත් වංචනික ක්‍රියා සිදු කිරීම.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් විභාග අක්‍රමිකතාවක් ලෙස සැලකෙන වෙනත් ඕනෑම විභාග වංචනික ක්‍රියාවක් සිදු කිරීම.

## 11.2 විභාග අක්‍රමිකතා සඳහා ක්‍රියාත්මක දඬුවම්

- විභාග අපේක්ෂකයාගේ පිළිතුරු පත්‍රය අවලංගු කිරීම සහ අදාළ ප්‍රශ්න පත්‍රයට නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.
- අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.
- උපාධි ප්‍රදානෝත්සවයට/සමර්පණෝත්සවයට නො කැඳවීම.
- අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.
- පන්ති/සම්මාන සාමර්ථ්‍යයක් ලබා නො දීම.
- ශිෂ්‍යභාවය වසරකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය වසර දෙකකින් හෝ තුනකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය වසර හතරකින් හෝ පහකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීම.
- ශිෂ්‍යයකු නොවන අවස්ථාවක දී ඔහුට/ඇයට එරෙහිව රටේ පවතින නීතියට අනුව ක්‍රියා කිරීම.
- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නො ගැනීම.

## 12. උපාධිය වලංගු වන දිනය

යම් උපාධි අපේක්ෂකයෙකු පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට උපාධි I, II සහ III පරීක්ෂණ සඳහා ප්‍රථම වරට පෙනී සිටිමින් අනුපිළිවෙලින් සමත් වන්නේ නම් උපාධිය සඳහා වලංගු දිනය වන්නේ තුන්වන අධ්‍යයන වර්ෂයේ විභාග කාලච්ඡේදය අවසන් වන දිනට පසු දිනය (ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නොවන) වේ.

යම් උපාධි අපේක්ෂකයෙකු එක් අධ්‍යයන වර්ෂයක් හෝ පුනර් පරීක්ෂණයකට පෙනී සිට ඇත්නම් පුනර් අපේක්ෂකයන්ගේ උපාධිය වලංගු වන දිනය වන්නේ එක් එක් කැලැන්ඩර් වර්ෂයෙහි ජුනි 30 හෝ දෙසැම්බර් 31 (හෝ එම දිනය රජයේ නිවාඩු දිනයක් හෝ ඉරිදා දිනයක් වන්නේ නම් එදිනට පසුව එළඹෙන වැඩ කරන දිනය) වශයෙන් අදාළ පරිදි ලබා දෙනු ලැබේ.

## 13. උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් වාර්ෂිකව පවත්වනු ලබන බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ දී ඒ වනවිට සිය උපාධි ආවශ්‍යකතා සම්පූර්ණ කර ඇති අපේක්‍ෂකයින්ට අදාළ පරිදි උපාධිය ප්‍රදානය කරනු ලැබේ. උපාධි ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව සනාතන සභා අනුමැතියට යටත්ව, සමත්වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තාවකාලික සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවයට ඉල්ලුම් කිරීම හා විධිමත් උපාධි සහතිකයට අදාළ ඉල්ලුම් පත්‍ර වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවය සඳහා කැඳවනු ලබන්නේ අයදුම් කළහොත් පමණි. වාර්ෂිකව පැවැත්වෙන උපාධි ප්‍රදානෝත්සවයේදී අදාළ අයදුම්කරුට විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ අතින් හෝ උපකුලපතිතුමා අතින් උපාධිය ප්‍රදානය කෙරේ. යම් අයදුම්කරුවකුට උපාධි ප්‍රදානෝත්සවයේ දී අභිමුඛයේ (Presence) හෝ අනභිමුඛයේ (Absentia) උපාධිය ලබාගත හැකිය. උපාධි ප්‍රදානෝත්සවයේ දී ප්‍රදානය කරනු ලබන මුල් සහතිකයේ පිටපත් හෝ අනුපිටපත් නැවත නිකුත් කරනු නො ලැබේ. උපාධි ප්‍රදානෝත්සවය සඳහා අභිමුඛයේ හෝ අනභිමුඛයේ ඉදිරිපත්වන උපාධිලාභීන් සඳහා ලබා දෙන උපාධි ලෝගුව සහ සාටකය නැවත විශ්වවිද්‍යාලයට භාර දී ඒ බව වාර්තා පොතේ සටහන් කරවා ගත යුතුය.

**විශේෂ අවධානය පිණිසයි**

1. බාහිර උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන පෞද්ගලික ආයතනයක සේවය කරන ආචාර්යවරයකු ප්‍රශ්න පත්‍ර සැකසීම, ප්‍රමිත කිරීම, පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම හෝ කිසිඳු අදාළ පරීක්ෂණ කටයුත්තක් සඳහා සහභාගි කරගනු නො ලැබේ.

2. විශ්වවිද්‍යාලයේ අධීක්ෂණය යටතේ අධ්‍යයනාංශ ප්‍රධානවරුන්ගේ හා පීඨාධිපතිගේ නිර්දේශයන් හා අධ්‍යයන මණ්ඩලයේ හා පීඨ මණ්ඩලයේ අනුමැතිය ලත් ආචාර්යවරුන්ට පමණක් දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීමට අවස්ථාව හිමි වේ.

3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පිරිනමනු ලබන සියලුම බාහිර උපාධි පාඨමාලා ලියාපදිංචි කිරීමේ සිට සියලුම කටයුතු මෙහෙයවනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් වන අතර එම කිසිඳු කාර්යයක් සම්බන්ධයෙන් වෙනත් කිසිඳු ආයතනයක මැදිහත් වීමක් සිදු නොවන බවත් එවැනි ආයතනයන්ට මුදල් ගෙවීම් සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වගකීමක් නො දරන බව ද අවධාරණය කරනු ලැබේ.

4. මෙම අත්පොතෙහි දක්වා ඇති ක්‍රමවේදයන්ගෙන් බැහැරව වෙනත් පාර්ශවයකගේ උපදෙස් මත කටයුතු කිරීම තුළින් උද්ගතවන ගැටලු විසඳා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිවක් සැලකිල්ලට නො ගන්නා අතර ඒවාට පිළිතුරු යොමු නො කරන බව ද අවධාරණය කරනු ලැබේ. එබැවින් මෙම ශිෂ්‍ය අත්පොතේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගත යුතුය. අදාළ උපාධි පාඨමාලාව හදාරා අවසන් වනතුරු මෙම අත්පොත සුරැකිව තබාගෙන ඊට අනුව කටයුතු කරන ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

5. බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන් විසින් පිහිටුවා ගනු ලබන සංසද හෝ වෙනත් සංවිධාන සඳහා විශ්වවිද්‍යාලය මගින් නිල වශයෙන් අවසර නො දෙන බැවින් ඒ පිළිබඳව සිදු කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නො ලැබේ. විශ්වවිද්‍යාලයේ අවසරයකින් තොරව කිසිඳු ආකාරයේ කටයුත්තක් සඳහා එහි නිල ලාංඡනය භාවිත කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

6. මෙම අත්පොතේ සඳහන් ඕනෑම කරුණක් අවශ්‍යතාව අනුව පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සතු වේ. එබඳු සංශෝධන වෙත්නම් ඒවා බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරනු ලැබේ.

සියලුම බාහිර උපාධි පාඨමාලාවන්ට අදාළ වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර, ලියාපදිංචිය දීර්ඝ කිරීම සහ උපාධි ප්‍රදානෝත්සවය ආදී සියලු කටයුතු සඳහා දැනුවත් කිරීම් www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය ඔස්සේ පමණක් සිදුකරනු ලැබේ. තැපැල් මගින් ලිපි එවනු නොලැබේ. එබැවින් නිතර නිතර අපගේ වෙබ් අඩවිය වෙත පිවිස අදාළ ශීර්ෂ යටතේ ඇති නිවේදන පිළිබඳ දැනුවත් වීම අනිවාර්ය වේ.

# විමසීම්


| | | |
|---|---|---|
| දුරකථන අංකය | :- | 011 - 2801481 |
| ෆැක්ස් | :- | 011 - 2802753 |
| ඊ-මේල් | :- | info.ext@sjp.ac.lk |
| වෙබ් අඩවිය | :- | www.external.sjp.ac.lk |
| විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය | :- | learnext.sjp.ac.lk |

**නියෝජ්‍ය ලේඛකාධිකාරී**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

**අංක 16, ඇස් ද ඇස් ජයසිංහ මාවත**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල නුගේගොඩ

දු.ක. : +94 112801481 / +94 113132496
ෆැක්ස් : +940112802753
වෙබ් අඩවිය : external.sjp.ac.lk
ඊ මේල් : info.ext@sjp.ac.lk
විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය : learnext.sjp.ac.lk